# පටුන


| | |
|---|---|
| ක්ෂණික යොමුව | 2 |
| අධ්‍යක්ෂගේ ප්‍රකාශය | 3 |
| දැක්ම | 6 |
| මෙහෙවර | 7 |
| කළමනාකරණ මණ්ඩලය | 8 |
| කාර්ය මණ්ඩලය | 8 |
| අන්තර්ජාතික පිළිගැනීම | 9 |
| විදේශ සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීම | 9 |
| මානව සම්පත් සංවර්ධනය | 10 |
| උපාධි ප්‍රදානෝත්සවය | 13 |
| බාහිර කථිකාචාර්ය මණ්ඩලය | 13 |
| පර්යේෂණ සම්මන්ත්‍රණ | 14 |
| බාහිර ආයතන සඳහා සම්පත් දායකත්වය | 17 |
| අධ්‍යයන කාර්යමණ්ඩලයේ පර්යේෂණ දායකත්වය | 18 |
| ආයතනයට පැමිණි විදේශීය අමුත්තන් | 18 |
| ඇගයීම් | 20 |
| පාඨමාලාවන් පිළිබඳ විස්තර | 21 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර | 22 |
| පරිපාලන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර | 23 |
| පර්යේෂණ ප්‍රකාශන පිළිබඳ විස්තර | 23 |
| වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර | 24 |
| පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර | 26 |
| පාඨමාලා නිබන්ධ ලැයිස්තු | 27 |
| විගණන වාර්තා | 32 |

**ක්ෂණික යොමුව**


<u>ලියාපදිංචි කාර්යාලය</u>
තැ.පෙ. 1698, කොළඹ 03.
www.nilis.cmb.ac.lk

<u>දුරකථන අංක</u>

| | |
|---|---|
| පොදු | : +94-11-250 7150 |
| අධ්‍යක්ෂ | : +94-11-250 7148 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි | : +94-11-250 7150 |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි | : +94-11-344 3634 |

ෆැක්ස් අංක : +94-11-2507150

ඊ මේල් : director@nilis.cmb.ac.lk

## අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය

ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය (NILIS) 1999 දී කොළඹ විශ්වවිද්‍යාලය යටතේ ස්ථාපිත කරන ලද්දේ ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කරන ලද සාමාන්‍ය අධ්‍යාපන II ව්‍යාපෘතියේ අංගයක් වශයෙනි. මෙම ව්‍යාපෘතිය යටතේ අලුතින් පාසල් පුස්තකාල ගොඩනැගිලි 2000ක් ඉදි කරන ලද අතර පවත්නා ගොඩනැගිලි 2000ක් ප්‍රතිසංස්කරණය කරන ලදී. මෙම පුස්තකාලවල සේවයේ නියුක්තව සිටි සහ අලුතින් බඳවා ගන්නා ලද කාර්ය මණ්ඩලවල අධ්‍යාපනික, වෘත්තීය සහ පුහුණු අවශ්‍යතා සපුරාලීම NILIS ආයතනයට පැවරිණි. ඒ අනුව පාසල් පුස්තකාල සඳහා බඳවා ගන්නා ලද නවක උපාධිධාරීන් සඳහා පුහුණු වැඩසටහන් දීපව්‍යාප්තව පවත්වන ලද අතර 2002 දී විධිමත් පාඨමාලා ආරම්භ කෙරිණි.

ගුරුපුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ ගුරුපුස්තකාල ශාස්ත්‍රපති පාඨමාලාව, ගුරුපුස්තකාලයාධිපති ඩිප්ලෝමා යන පාඨමාලා පාසල් පුස්තකාල ක්ෂේත්‍රය ඉලක්ක කරමින් ද අනෙකුත් පුස්තකාල වර්ගවල සේවයේ නියුතු වූවන් සඳහා පුස්තකාල හා තොරතුරු විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ පුස්තකාල හා තොරතුරු කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ප්‍රථමයෙන්ම පවත්වන ලදී. එමෙන්ම 2006 වර්ෂයේදී පුස්තකාල හා තොරතුරු විද්‍යා ශාස්ත්‍රපති පාඨමාලාව ද (එතෙක් උසස් උපාධි ආයතනය යටතේ පැවති) NILIS ආයතනයට පවරා ගැනිණි.

2008 සහ 2009 වර්ෂ වන විට ගුරුපුස්තකාලයාධිපති පාඨමාලා සඳහා ඇති ඉල්ලුම ක්‍රමයෙන් අඩු වන්නට විය. මීට ප්‍රධාන හේතුව වූයේ ගුරුපුස්තකාලයාධිපතින්ගේ උසස් වීමේ පටිපාටියට අදාළ සුදුසුකමක් ලෙස එම පාඨමාලා ගුරු සේවා ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය තිබියදී පවා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රමාද කිරීමයි.

මේ නිසා NILIS ආයතනය විකල්ප උපායමාර්ගයක් වෙත යොමු විය. ඒ අනුව, පුස්තකාල හා තොරතුරු විද්‍යා පශ්චාත් උපාධි පාඨමාලාවට අදාළ ඇතුළත් වීමේ සුදුසුකම් සංශෝධනය කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස එම පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව ඉහළ නැංවිනි. මේ අනුව 2014 වර්ෂය තුළ අනෙක් වසරවලට සාපේක්ෂව ඉහළ ආදායමක් වාර්තා කිරීමට NILIS ආයතනය සමත් විය.

පාසල් පුස්තකාලවල මානව සම්පත ගුණාත්මකව සංවර්ධනය කිරීම NILIS ආයතනයේ එක් අරමුණක් බැවින් එම පුස්තකාලවල සහායක කාර්ය මණ්ඩල සඳහා පාසල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක්ද ආරම්භ කෙරිණි. එම පාඨමාලාවලට රටපුරා විශාල ඉල්ලුමක් පවතින අතර එකී පාඨමාලා ප්‍රාදේශීය මට්ටමින් පැවැත්වීමට ද යෝජනා ඉදිරිපත් වී තිබේ.

### NILIS සුවිශේෂීත්වය

කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය පිහිටුවන ලද්දේ ශ්‍රී ලංකාවේ විවිධ ආයතනවල පුස්තකාල ක්ෂේත්‍රයට සම්බන්ධ සේවා නියුක්තිකයන් ගුණාත්මකව සවිබල ගැන්වීමටය. මෙම ආයතනය පිහිටුවීම පාසල් පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයට ලෝක බැංකු ආධාර ව්‍යාපෘතියත් සමඟ බැඳී ඇති හෙයින් එහි වැඩි අවධානය පාසල් පුස්තකාල ක්ෂේත්‍රයට යොමු

කෙරිණි. ඒ අනුව පාසල් පුස්තකාල ක්ෂේත්‍රයේ භෞතික සම්පත් සංවර්ධනයට සාපේක්ෂව දියුණු මානව සම්පතක් නිර්මාණය කිරීම සඳහා පාඨමාලා සම්පාදනය කරන ලදී.

කැලණිය විශ්වවිද්‍යාලයේ දැනට  දශක කීපයක සිට පුස්තකාල හා විඥාපන විද්‍යා උපාධි, පශ්චාත් උපාධි සහ ඩිප්ලෝමා පාඨමාලා පවත්වාගෙන යමින් තිබියදී කොළඹ විශ්වවිද්‍යාලය තුළ එම විෂය ක්ෂේත්‍රයට අදාළ තවත් ආයතනයක් ආරම්භ කිරීමට වැදගත් හේතුවක් තිබිණි. එනම් කැලණිය විශ්වවිද්‍යාලයේ පාඨමාලාවන් මූලික වශයෙන් පවත්වනුයේ න්‍යායාත්මක අංශයට වැඩි නැඹුරුවක් සහිතව (ශුද්ධ පුස්තකාල හා විඥාපන විද්‍යා) වීමයි. එම පාඨමාලාවල විෂයමාලා නිරීක්ෂණය කිරීමෙන් ඒ බව පැහැදිලි වේ. එම පාඨමාලා ප්‍රධාන වශයෙන් යොමුවී ඇත්තේ උපාධි අපේක්ෂකයන්ට සහ එම ක්ෂේත්‍රයේ රැකියා අපේක්ෂා කරන පිරිසක් වෙතය. එහෙත්  NILIS පාඨමාලා න්‍යායාත්මක අංශයට වඩා ව්‍යවහාරික හෝ ප්‍රායෝගික අංශයට වැඩි නැඹුරුවක් දක්වයි. ඒ බව NILIS විෂය මාලා ඉගැන්වීම් ක්‍රමවේද  පැවරුම් ව්‍යාපෘති, පර්යේෂණ නිබන්ධ, යන සෑම අංශයකින්ම මැනවින් විද්‍යාමාන වේ. මෙයට හේතුව NILIS පාඨමාලාවන් බහුතරයක් පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ සේවයේ නියුක්ත පිරිසක් සඳහා වීමයි.

**අභියෝග**

NILIS ආයතනය දිගින් දිගටම මුහුණ දුන් අභියෝගය වූයේ ගුරු පුස්තකාලයාධිපති පාඨමාලා ගුරු පුස්තකාලාධිපතින්ගේ උසස් වීම් සුදුසුකමක් ලෙස ගුරු සේවා ව්‍යවස්ථාවට ඇතුළත් නොකිරීමයි. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබියදී පවා එම කාර්ය ඉටු කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු නොකර සිටීම බරපතල කරුණක් විය. ගුරු සේවයේ උසස්වීම් සුදුසුකම්  ලෙස තවමත් පිළිගන්නේ මීට දශක පහකට පමණ පෙර තිබූ සුදුසුකම් වේ. එහෙත් නව තනතුරු සහ ඊට අදාළ නව පාඨමාලා බිහිවීමත් සමඟ ඒවා අදාළ පටිපාටිවලට ඇතුළත් කිරීම පරිපාලන නිළධාරීන් විසින් කළ යුතු කාර්යයකි.  NILIS ආයතනය ඊට අදාළ සියලු උත්සාහයන් හා ක්‍රියාමාර්ග ගෙන තිබුණද අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුළුල් වීමට සාපේක්ෂව බඳවා ගැනීම් යාවත්කාලීන නොවීමේ ගැටලුව හමුවේ ඉහත පාඨමාලා සඳහා ඇති ඉල්ලුම අඩුවීමක් දක්නට ගැබේ. එහි වගකීම ගත යුත්තේ NILIS නොව අධ්‍යාපන අමාත්‍යාංශයයි. කෙසේ වුවද NILIS අයතනය මේ සම්බන්ධෙයන් දිගින් දිගටම අමාත්‍යතුමා සහ නිලධාරීන් සමඟ  පවත්වා ඇත.

**අනාගත ක්‍රියාමාර්ග**

ගුරු පුස්කතාලයාධිපති පාඨමාලා යනු NILIS හි එක් පාඨමාලා වර්ගයක් පමණි. NILIS නියමාවලියට අනුව එය පිහිටුවීමේ අරමුණ හුදෙක් ගුරු පුස්තකාලයාධිපති පාඨමාලා පැවැත්වීමම නොවේ. ශ්‍රී ලංකාවේ සියලුම පුස්තකාල ක්ෂේත්‍රවල මානව සම්පත දියුණු තලයකට ගෙන ඒම එහි මූලික අරමුණයි. මේ නිසා  NILIS ආයතනය පාඨමාලා විවිධාංගීකරණය සඳහා පියවර ගන්නා ලදී. මේ අනුව 2013 දී 77 දක්වා පහත පහත බැස තිබූ ශිෂ්‍ය සංඛ්‍යාව 2014 දී 132 දක්වා ඉහළ නංවා ගැනීමට හැකියාව ලැබිණි. එසේම පාසල් පුසතකාලවලට විශාල වශයෙන් බඳවා ගන්නා ලද සහායක කාර්ය මණ්ඩල සඳහා පවත්වන පාසල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව වඩාත් ව්‍යාප්ත කිරීමට පියවර ගැනිනි. එය NILIS හි අනාගත ප්‍රධානම ඉලක්කය වෙළඳපොළ බවට පත් කර ගැනීමට කටයුතු සැලසුම් කරමින් සිටී. ඉදිරි වර්ෂ දෙක තුළ එම ඉලක්කය සපුරා ගැනීම අපගේ හි අපේක්ෂාව වේ.

එමෙන්ම රට තුළ පුස්තකාල හා තොරතුරු සේවාවේ සුවිශේෂ අවශ්‍යතා සපුරාලීම සඳහා විශේෂ කෙටිකාලීන පාඨමාලා ආරම්භ කිරීමේ සැලසුමක් ද සම්පාදනය කරමින් පවතී. තවද, පළාත් පාලන නිලධාරීන් සමඟ සාකච්ඡා කර මහජන පුස්තකාල ක්ෂේත්‍රය ඉලක්ක කර පවත්වන පාඨමාලා පුළුල් කිරීමෙන් ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නංවා ගැනීමට අපේක්ෂා කෙරේ.

2000 දශකය මුල් භාගයේදී මෙරට පාසල් පුස්තකාල ක්ෂේත්‍රය සංකල්පීය පරිවර්ථනයකට බඳුන් විය. එම සංකල්පීය පරිවර්තනය යථාර්ථයක් බවට පත් කිරීමට නම් නව දැනුම, ආකල්ප සහ කුසලතා සහිත මානව සම්පතක් බිහි කිරීම අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියක් විය. පොදු පුස්තකාල විද්‍යා පාඨමාලා තුළින් මෙම අවශ්‍යතාව සපුරා ගත නොහැකි බව පැහැදිලිය. NILIS ආයතනය විසින් පාසල් පුස්තකාල කාර්ය මණ්ඩල ඉලක්ක කර සුවිශේෂ පාඨමාලා පවත්වාගෙන යන ලද්දේ එබැවිනි. වත්මන් තොරතුරු හා දැනුම සමාජය තුළ තොරතුරු හා දැනුම බිහිවීමේ සීග්‍රතාව හේතු කොට ගෙන ඕනෑම විෂය ක්ෂේත්‍රයක පොදු පාඨමාලාවල ඵලදායිත්වය වියැකෙමින් පවතී.

මෙම සංකල්පීය පරිවර්තනයේ ප්‍රධාන අංගයක් වූයේ පාසල් පුස්තකාලයේ කාර්ය භාරය ප්‍රබල වෙනසකට බඳුන් කිරීමයි. නිශ්ශබ්ද කියවීම, පොත් නිකුත් කිරීම සහ ආපසු භාර ගැනීම වැනි සාම්ප්‍රදායික කාර්යයන්ට සීමා වී තිබූ පාසල් පුස්තකාලය ඉන් ඔබ්බට ගොස් තොරතුරු කුසලතා ඉගැන්වීමේ යෙදෙන අවකාශයක් බවට පරිවර්තනය කිරීම එකී අභියෝගාත්මක කාර්යය විය. NILIS පාසල් පුස්තකාල පාඨමාලා මුළුමනින්නම සැකසී ඇත්තේ මෙම අභියෝග ජයගත හැකි පිරිසක් නිර්මාණය කිරීම සඳහාය. පොදු පුස්තකාල හා තොරතුරු විද්‍යා පාඨමාවල නොමැති තොරතුරු සාක්ෂරතාව, ළමා හා යොවුන් සාහිත්‍යය, අන්තර්ජාල සාක්ෂරතාව, මාධ්‍ය සාක්ෂරතාව යනාදී විශයයන් NILIS ආයතනය පාසල් පුස්තකාල පාඨමාලාවලට ඇතුළත් තර ඇත්තේ එහෙයිනි. මෙම කුසලතා අත්පත් කර නොගන්නා ඉගෙනුම් ක්‍රම ඵල රහිත වූවක් බව වර්තමාන අධ්‍යාපනඥයෝ පොදුවේ පිළිගනිති. සිසුන්ට එම තොරතුරු කුසලතා අත්කර දිය හැකි ස්ථානය වන්නේ පාසල් පුස්තකාලයයි. එහෙයින් NILIS උත්සාහ කරනුයේ එම කාර්යයට ගැලපෙන පිරිසක් පාසල් පද්ධතියට එක් කිරීමටය. මෙය අභියෝගාත්මක කාර්යයක් වුවද එය යම් පමණකට සාර්ථක කර ගැනීමට NILIS පාසල් පුස්තකාල පාඨමාලා හදාරා නිම කළ සිසුන් සමත්ව තිබීම සතුටට කරුණකි. සංඛ්‍යාත්මකව මෙම පිරිස සුවිශාල නොවුනද ඔවුන් පාසල් පුස්තකාල ක්ෂේත්‍රය තුළ කරන ලද ගුණාත්මක වෙනස ප්‍රශංසනීය වේ. එය මූල්‍යමය වටිනාකමක් තක්සේරු කළ නොහැකි සමාජමය ලාභයකි.

අධ්‍යක්ෂ
ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය

**දැක්ම**

පුස්තකාල හා තොරතුරු කළමනාකරණ
ක්ෂේත්‍රයේ දැනුම, අධ්‍යාපනය, පර්යේෂණ හා
ව්‍යවසායකත්වය අතර
මනා සම්බන්ධතාවක් ගොඩ නංවමින්
ජාත්‍යන්තර වශයෙන්
කීර්තිමත් විශිෂ්ටත්වයේ
මධ්‍යස්ථානයක් බවට පත් වීම.

## මෙහෙවර

ජාතික සංවර්ධනයේ දී කේන්ද්‍රීය භූමිකාවකට ජීවය දිය හැකි ඉහළ නිපුණතාවක් සහ පරිපූර්ණත්වයක් මෙන්ම ම අද්විතීය ගුණාත්මකභාවයක් සහිත අත්‍යවශ්‍ය මානව සම්පත් තොරතුරු කළමනාකරණ ක්ෂේත්‍රය තුළ නිපදවීම.

## කළමනාකරණ මණ්ඩලය

මහාචාර්ය රංජිත් සේනාරත්න, උප සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ඩබ්ලිව්. සුනිල්, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

ජී.ආර්. පද්මසිරි, පුස්තකාලයාධිපති, සෞන්දර්ය හා කලා විශ්වවිද්‍යාලය

ඩී.අයි. අන්ද්‍රාදි, සභාපති, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය

මහාචාර්ය රසල් බෝඩින්, ඉෆ්ලා සාමාජික

ආචාර්ය වත්මානෙල් සෙනෙවිරත්න, පුස්තකාලයාධිකාරි, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

එන්.ජී. දයාරත්න, අධ්‍යක්ෂ ජනරාල් (මෙහෙයුම් හා විමර්ශන), මුදල් හා සැලසුම් අමාත්‍යාංශය

මහාචාර්ය ඩබ්. චන්ද්‍රදාස, පීඨාධිපති, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

අනුර ජයලත් සිල්වා, අධ්‍යාපන අධ්‍යක්ෂ, පාසල් පුස්තකාල සංවර්ධන ඒකකය, අධ්‍යාපන අමාත්‍යාංශය

බී.එම්.එස්. බණ්ඩාර, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

එල්.ඒ. ජයතිස්ස, පුස්තකාලයාධිපති, කැලණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය ජී.එන්. වික්‍රමනායක, අධ්‍යක්ෂ, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

ප්‍රසන්න රණවීර, අධ්‍යක්ෂ, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය

## කාර්ය මණ්ඩලය

### ස්ථිර සේවක සංඛ්‍යාව

| | |
|---|---|
| ආ.ර්.පී.පී රණවීර මහතා | - අධ්‍යක්ෂ |
| පී.ජී. පේමදාස මහතා | - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය |
| ආචාර්ය රුවන් ගමගේ මහතා | - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය |
| යූ.පී. අලහකෝන් මහතා | - සහකාර පුස්තකාලයාධිපති |
| එච්.වී.එස්.එම්.ජයසේකර මිය | - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි |
| ඒ.අබේරත්න මිය | - සහකාර ලේඛකාධිකාරි |
| ඒ.එන්.එල් හේරත් මිය | - ලිපිකරු II ශ්‍රේණිය |
| ටී.එච්.ආර්.බී. චන්ද්‍රතිලක මිය | - පරිගණක යෙදවුම් සහකාර III ශ්‍රේණිය |
| එන්.කේ. කුරුප්පුආරච්චි මහතා | - පරිගණක යෙදවුම් සහකාර III ශ්‍රේණිය |
| කේ.එම්.එන්.කේ බණ්ඩාර මහතා | - පොත් තබන්නා II (B) ශ්‍රේණිය (2013.03.14 දින දක්වා) |
| එස්.ඒ.ඩී.ටී.එන්. රත්නායක මහතා | - පොත් තබන්නා II (B) ශ්‍රේණිය (2013.12.11 දින සිට) |
| එස්.බී. වෙත්තසිංහ මිය | - පුස්තකාල සහකාර III ශ්‍රේණිය |
| ඒ.ඒ.ජේ. අබේසිංහ මහතා | - රියදුරු |

**තාවකාලික සේවක සංඛ්‍යාව**

අයි. ආර්. ශ්‍යාමලී මිය - පුහුණුවන පරිගණක යෙදවුම් සහකාර (2007.04.17 සිට)
කේ.කේ. රූබසිංහ මහතා - පුහුණුවන පරිගණක යෙදවුම් සහකාර (2011.07.01 සිට)
එන්.ආර්. ජයකොඩි මෙනවිය - පුහුණුවන පරිගණක යෙදවුම් සහකාර (2011.12.15 සිට)

**<u>අන්තර්ජාතික පිළිගැනීම</u>**

ඉන්දියාවේ මයිසූර් විශ්වවිද්‍යාලයේ තොරතුරු කළමනාකරණ ආයතනය සමග එකඟතා ගිවිසුමක් අත්සන් කිරීම මගින් දෙපාර්ශවය අතර දැනුම, තොරතුරු හුවමාරු කිරීමත් මානව සම්පත් සංවර්ධනයේ දී අන්‍යොන්‍ය සහාය ලබා ගැනීමත් සිදු කිරීමට අවස්ථාව ලැබිණි. තොරතුරු කළමනාකරණ ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර වශයෙන් කීර්තිමත් ආයතනයක් සමග ශාස්ත්‍රීය හවුල්කරුවෙකු ලෙස අඛණ්ඩව කටයුතු කිරීමට ලැබීම මෙම වර්ෂයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය ලද සුවිශේෂ ජයග්‍රහනයකි.

## විදේශ සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා සහභාගී වීම

- ආයතනයේ අධ්‍යක්ෂ ආර්.පී.පී.රණවීර මහතා 2014 නොවැම්බර් 4-5 මැලේසියාවේ පැවති අන්තර්ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා සම්මන්ත්‍රණයට සහභාගී විය.
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් වන ආචාර්ය රුවන් ගමගේ සහ පී. ජී.පේමදාස යන මහත්වරුන් මාලදිවයිනේ පැවති ගුරුවරුන් සහ පුස්තකාලයාධිපතින් සඳහා පැවති දකුණු ආසියාතික වැඩමුළුවේ සම්පත්දායකයන් ලෙස සහභාගී වූහ.
- පරිගණක යෙදවුම් සහකාර ආර්.චන්ද්‍රතිලක මහත්මිය අප්‍රේල් 07 සිට 10 දක්වා ඉන්දියාවේ නවදිල්ලියේ දකුණු ආසියානු ප්‍රලේඛන මධ්‍යස්ථානය මගින් පවත්වන ලද තොරතුරු කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණය පිළිබඳ කෙටි කාලීන පුහුණු පාඨමාලාවකට සහභාගී විය.

## මානව සම්පත් සංවර්ධනය

නිලීස් ආයතනය දර්ශනපති /ආචාර්ය උපාධි මට්ටමේ සිට සහතිකපත්‍ර මට්ටම දක්වා පාඨමාලා පවත්වනු ලබයි.

**දර්ශනපති ආචාර්ය උපාධි (MPhil/PhD) වැඩසටහන්**

NILIS හි පෙර වර්ෂවදී ලියාපදිංචි වූ සිසුන් පස්දෙනෙක් තම අධ්‍යයන කටයුතුවල නිරත වන අතර 2014 වර්ෂයේදී සිසුන් 05 දෙනෙකු අලුතින් ලියාපදිංචි වූහ. පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ විස්තර අංක 01 වගුවේ දැක්වේ.

**<u>ශාස්ත්‍රපති වැඩසටහන්</u>**

NILIS ආයතනයෙහි පහත සඳහන් ශාස්ත්‍රපති වැඩසටහන් ක්‍රියාත්මක වේ.

- පුස්තකාල හා විඥාපන විද්‍යා ශාස්ත්‍රපති පාඨමාලාව
- තොරතුරු කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව
- ගුරු පුස්තකාලයාධිපති ශාස්ත්‍රපති පාඨමාලාව

පුස්තකාල හා විඥාපන විද්‍යා ශාස්ත්‍රපති (MLS) පාඨමාලාව සඳහා 2013 වර්ෂයේදී ලියාපදිංචි වූ සිසුන් 06ක් තම පර්යේෂණ නිබන්ධයේ කටයුතුවල නිරත වූහ. (පර්යේෂණ මාතෘකා 2 වගුවේ දැක්වේ) 2014/15 කණ්ඩායම සඳහා සිසුන් 07 දෙනෙක් ලියාපදිංචි වී ඇති අතර ඔවුන් තම පාඨමාලා කටයුතුවල නිරත වේ.

තොරතුරු කළමකාරණය පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාවේ 2013/2014 සිසුන් කණ්ඩායම තම පර්යේෂණ නිබන්ධය සම්පූර්ණ කිරීමේ කටයුතුවල යෙදිනි.

ගුරුපුස්තකාල ශාස්ත්‍රපති පාඨමාලාව සඳහා 2014/15 කණ්ඩායම (පූර්ණ කාලීන) සඳහා සිසුන් 06 දෙනෙකු ලියාපදිංචි වී ඇත.

**<u>පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා</u>**

NILIS ආයතනයේ පහත සඳහන් පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවන් පවත්වනු ලබයි.

- පුස්කතාල හා විඥාපන විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- තොරතුරු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

පුස්තකාල හා විඥාපන විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවේ 2013/2014 සඳහා ලියාපදිංචි වූ සිසුන් 18 දෙනෙකු තම පර්යේෂණ නිබන්ධයේ කටයතුවල නිරත වූහ. (පර්යේෂණ මාතෘකා 3 වගුවේ දැක්වේ) මෙයට අමතරව මෙම පාඨමාලා සඳහා 2014 දී සිසුන් 12 දෙනෙකු ලියාපදිංචි වූහ.

තොරතුරු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව 2012/2014 සිසුන් කණ්ඩායම ඔවුන්ගේ පර්යේෂණ නිබන්ධය සම්පූර්ණ කිරීමේ කාර්යයෙහි නියැලුනහ. 2014/16 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් පස් දෙනෙකු ලියාපදිංචි වී ඇත.

ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව 2012/2013 අර්ධකාලීන කණ්ඩායමේ සිසු සිසුවියන් පර්යේෂණ නිබන්ධයේ කටයුතුවල යෙදුණු අතර 2014/2015 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් පස් දෙනෙකු පූර්ණකාලීන පාඨමාලාව හැදෑරීමට ලියාපදිංචි වී ඇත. (පර්යේෂණ මාතෘකා 4 වන වගුවේ දැක්වේ)

**ඩිප්ලෝමා පාඨමාලා**

NILIS ආයතනය පහත සඳහන් ඩිප්ලෝමා පාඨමාලා පවත්වනු ලබයි.

- පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව
- පාසල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- මහජන පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව වසර 03 ක පාඨමාලාවක් වන අතර එහි පළමු වර්ෂය පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ප්‍රථම සහතිකපත්‍ර පාඨමාලාව ලෙසද දෙවන වර්ෂය පුස්තකාල හා තොරතුරු කළමනාකරණ අන්තර්මධ්‍ය පාඨමාලාව ලෙසද තෙවන වර්ෂය පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව ලෙසද පැවැත්වේ. මේ අනුව පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ප්‍රථම සහතිකපත්‍ර පාඨමාලාව සඳහා 2014 වර්ෂයේදී සිසුන් 15 දෙනෙකු ලියාපදිංචි වී ඇති ඇත. පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමාව සඳහා 2013 දී ඇතුළත් වූ සිසුන් 12 දෙනෙකු සිය අධ්‍යාපන කටයුතු 2014 වසර තුළ ද අඛණ්ඩව සිදු කළහ.

පාසල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ 2013/2014 සිසු කණ්ඩායම 2014දී පාඨමාලාව සම්පූර්ණ කළ අතර 2014 දී මෙම පාඨමාලාව සඳහා සිසුන් 17 දෙනෙකු බඳවා ගැනිණි.

මහජන පුස්කතාලයාධිපතිත්වය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ 2013/2014 කණ්ඩායමේ අධ්‍යයන කටයුතු අඛණ්ඩව සිදු කෙරිණි.

## සහතික පත්‍ර පාඨමාලා

NILIS ආයතනය පහත සඳහන් සහතික පත්‍ර පාඨමාලා පවත්වනු ලබයි.

- පාසල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- මහජන පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- ඉංග්‍රීසි සහ තොරතුරු සාක්ෂර කුසලතා පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව.

පාසල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සඳහා 2014 දී සිසුන් 11 දෙනෙකු ද මහජන පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සඳහා සිසුන් 09 දෙනෙකු ද මෙම වසරේදී ලියාපදිංචි වී ඇත.

උසස් පෙළ විභාගය නිම කළ සිසුන් සඳහා ඉලක්ක කර ආරම්භ කරන ලද ඉංග්‍රීසි භාෂාව සහ තොරතුරු සාක්ෂර කුසලතා පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සඳහා සිසුන් 28 දෙනෙකු ලියාපදිංචි වූහ.

## කෙටිකාලීන පාඨමාලා

මෙරට පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රය තුළ දියුණු මානව සම්පතක් නිර්මාණය කිරීම සඳහා ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය විවිධ කෙටි කාලීන පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. මේ අනුව කාර්යාල කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණය යන මැයෙන් 2014.03.04 සිට 2014.06.05 දක්වා ද 2014.09.04 සිට 2014.10.16 දක්වා ද වශයෙන් පුහුණු වැඩසටහන් දෙකක් මෙම වර්ෂය තුළ දී පවත්වන ලද අතර ඊට සහභාගී ව පිරිස 33 කි. මෙම පුහුණු වැඩසටහනෙහි සම්පත්දායකයන් වශයෙන් NILIS ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් මෙන්ම මානව සම්පත් අභිවර්ධන ආයතනයේ සහ කළමනාකරණ පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්ද පරිපාලන ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ද කටයුතු කළහ.

2014.03.15 දින සිට ඩිජිටල් පුස්තකාල පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. මේ සඳහා විවිධ පුස්තකාල වර්ග නියෝජනය කරමින් පුස්තකාල වෘත්තිකයන් 21 ක් සහභාගී වූහ. මෙම වැඩමුළුවේ සම්පත්දායකයන් ලෙස NILIS ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ද මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිද කටයුතු කළහ.

පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ වැඩසටහනක් 2013.11.27 සිට 2014.02.02 දක්වා පවත්වන ලද අතර ඊට විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් 33 දෙනෙකු සහභාගී විය. කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් යනාදීන් එයට සම්පත් දායකත්වය සැපයූහ.

දර්ශනපති/දර්ශනසූරී උපාධි හදාරණ සිසුන් සඳහා සම්මන්ත්‍රණයක් 2014.11.22 පවත්වන ලදී.එය මෙහෙයවන ලද්දේ මැලේසියාවේ මලයා විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශයේ මහාචාර්ය ඩිල්ජිත් සිං විසිනි. එයට දර්ශනපති/දර්ශනසූරී උපාධි පර්යේෂණවල නියැලෙන සිසුන් සහභාගී වූහ

## උපාධි ප්‍රදානෝත්සවය

2014 වර්ෂයේ දී පැවති කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවයේදී ශාස්ත්‍රපති උපාධිධාරීන් දෙදෙනෙක් ද පශ්චාත් උපාධි ඩිප්ලෝමා උපාධිධාරීන් 10 දෙනෙක් ද උපාධි ලබා ගත්හ.

## බාහිර කථිකාචාර්ය මණ්ඩලය

NILIS ආයතනයේ ස්ථිර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සිටිනුයේ තිදෙනෙක් පමණක් බැවින් පාඨමාලාවල දේශන කටයුතු සඳහා වැඩි වශයෙන් බාහිර කථිකාචාර්යවරුන්ගේ සහාය ලබා ගැනේ.

ඒ අනුව පහත සඳහන් විද්වතුන් ආයතනයේ පශ්චාත් උපාධි පාඨමාලාවල දේශකයන් වශයෙන් සහභාගී වී ඇත.

මහාචාර්ය පියදාස රණසිංහ, කැලණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය ඉන්ද්‍රලාල් ද සිල්වා, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

මහාචාර්ය ගාමිණී ද අල්විස්, කළමනාකරණ පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

මහාචාර්ය ඩිල්ජිත් සිං, මලයා විශ්වවිද්‍යාලය, මැලේසියාව

ආචාර්ය වත්මානෙල් සෙනෙවිරත්න, පුස්තකාලයාධිකාරි, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ආචාර්ය ඩී.කේ.ඩී. ජයකොඩි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වයඹ විශ්වවිද්‍යාලය

ආචාර්ය කේ.ඩී.ජී. විමලරත්න, හිටපු අධ්‍යක්ෂ, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

හැරිසන් පෙරේරා, හිටපු පුස්තකාලයාධිපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ජී.ආර්. පද්මසිරි, පුස්තකාලයාධිපති, සෞන්දර්ය හා කලා විශ්වවිද්‍යාලය

එල්.ඒ. ජයතිස්ස, පුස්තකාලයාධිපති, කැලණිය විශ්වවිද්‍යාලය

එම්.එන්. රවිකුමාර්, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, නැගෙනහිර විශ්වවිද්‍යාලය

එල්.එම්. උදය ප්‍රසාද් කබ්රාල්, ලේඛන සංරක්ෂක , ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

ටී. රමනන්, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, නැගෙනහිර විශ්වවිද්‍යාලය

හර්ෂ බාලසූරිය, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පී.කේ.සී.එම්. විජේවික්‍රම, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, සබරගමුව විශ්වවිද්‍යාලය

ජේ.එම්.පී.පී. ජයසිංහ, කථිකාචාර්ය, තොරතුරු තාක්ෂණ පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය

ජී.ජේ.ගුණවර්ධන, ඉංජිනේරු-පාරිභෝගික නිෂ්පාදන අලෙවිකරණය, ශ්‍රී ලංකා ටෙලිකොම්

ඩී.එම්.පී. බණ්ඩාරනායක, පුස්තකාල අධ්‍යක්ෂ, ඇමරිකානු තොරතුරු මධ්‍යස්ථානය

ටී. ප්‍රතිපන්, සහකාර පුස්තකාලයාධිපති, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

බුද්ධින් කුමාර, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, මොරටුව විශ්වවිද්‍යාලය

මනෝජා සමරදිවාකර, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

චන්දන විජේකෝන්, කථිකාචාර්ය, කළමනාකරණ පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

## NILIS පර්යේෂණ සම්මන්ත්‍රණ

NILIS පර්යේෂණ සම්මන්ත්‍රණය 2014 නොවැම්බර් 21 දින කොළඹ විශ්වවිද්‍යාලයේදී පවත්වන ලදී. මේ සඳහා සැසිවාර 6 ක් සහ තේමා හයක් යටතේ පර්යේෂණ පත්‍රිකා 26 ක් ඉදිරිපත් කෙරිණි. තොරතුරු සමාජය ගැටළු සහ හැකියාවන්, 21 වන සියවසේ ඉගෙනුම තුළ පුස්තකාලයාධිපතිගේ භූමිකාව, තොරතුරු සාක්ෂරතාව වර්ධනය කිරීම, හවුල්කාරීත්වය ගොඩනැංවීම යහපත් අනාගතයකට පියවර තැබීම, පාසල් පුස්තකාල ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය ව්‍යවහාර, ළමා කතා සාහිත්‍යය සහ කියවීම ප්‍රවර්ධනය පන්තිකාමර සඳහා අන්තර්ජාලය යනාදිය එකී තේමාවන් වේ. මෙයට අමතරව විවිධ තේමා යටතේ පෝස්ටර් සැසියක්ද පැවැත්විණි. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

දෘෂ්ටිවාදය පිළිබඳ කතිකා නිෂ්පාදන කෙරෙහි නූතන සමාජ වෙබ් අඩවිවල දායකත්වය
**සුනිල් වික්‍රමසිංහ**

සමාජ මාධ්‍ය සහ අලෙවිකරණය : ශ්‍රී ලංකාවේ ප්‍රධාන විශ්වවිද්‍යාල පුස්තකාලවල සම්පත් හා සේවා ප්‍රවර්ධනයේදී මුහුණුපොත ඵලදායීව භාවිත කරයිද?
**ලයනල් අමරකෝන්, තුෂාරි සෙනවිරත්න**

ශ්‍රී ලංකාවේ උපායමාර්ගික අධ්‍යාපනය සඳහා වූ කලාපීය මධ්‍යස්ථාන පුස්තකාලය මගින් සපයන ඉලෙක්ට්‍රොනික සේවාවන් පිළිබඳ ඇගයීමක්
**කමනි පෙරේරා, රුවන් ගමගේ**

පංති කාලසටහන් සඳහා ගූගල් ඩ්‍රයිව් භාවිතා කිරීම
**රුවන් ගමගේ**

එකතු සංවර්ධන මෙවලමක් ලෙස විද්‍යාපති උපාධිවල උපහාරණ විශ්ලේෂණයක්
මොරටුව විශ්වවිද්‍යාලයේ සිද්ධි අධ්‍යයනයක්
**සී.එන්.ඩී.පුංචිහේවා**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි සිසුන් විසින් කරනු ලබන තොරතුරු සම්පත් භාවිතය පිළිබඳ අධ්‍යයනයක් : නිබන්ධ පිළිබඳ උපහැරණ විශ්ලේෂණයක්.
**හිරුණි කාංචනා, තනූජා රණවැල්ල සහ මංජුල රාජපක්ෂ**

ශ්‍රී ලංකාවේ පුස්තකාලවල බහුපරම්පරාමය වෘත්තීය පුස්තකාල ශ්‍රම බලකාය අතර රැකියා තෘප්තිය.
**ලක්මිණී මාරසිංහ, අනූෂා විජේරත්න**

උපාධි අපේක්ෂකයන්ගේ පූර්ව පුස්තකාල අත්දැකීම් සහ අවබෝධයන් පිළිබඳ විග්‍රහයක්
**කේ.ජී.අනුර ප්‍රියදර්ශන කිරිඇල්ල**

2013 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සිංහල භාෂාමය ග්‍රන්ථ ප්‍රකාශනයේ විෂය විවිධත්වය පිළිබඳ ප්‍රමාණාත්මක විශ්ලේෂණයයි.
**උදිත අලහකෝන්**

ශ්‍රී ලංකාවේ වවුනියා දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාලවල වත්මන් තත්වය : සමාජයට සේවා සැපයීමේදී සම්පත් අභියෝග සහ පුස්තකාලායාධිපතිගේ භූමිකාව
**ශන්මුගදාසන් ශන්මුගරත්නම්, රමනන් තන්කවඩිවේල්**

ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන උපාධි අපේක්ෂකයන්ගේ තොරතුරු වෙත ස්ථානගතවීම පිළිබඳ ඇගයීමක්
**ක්‍රිශාන්තන් ප්‍රේමදාසන්**

ගැටළු පාදක ඉගෙනුම් හඳුනා ගැනීම සඳහා තොරතුරු සාක්ෂරතා ආදර්ශයක් සංවර්ධනය කිරීම
**එස්. සාන්තරූබන්, පී.ජී.පේමදාස**

පාසල් පුස්තකාල ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන සංවර්ධනය කෙරෙහි අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්ය භාරය
**ආර්.එච්.එන්.නන්දසිරි**

ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම සඳහා සම්පත් දායකයන්ගේ ඉගැන්වීමේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක්
(මධ්‍යම පළාතේ අධ්‍යාපන කලාප 15 හි තෝරාගත් පාසල් ඇසුරෙන්)
**පී.ජී.පේමදාස**

ඉංග්‍රීසි විශයෙහි ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම සඳහා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය යොදා ගන්නා ආකාරය පිළිබඳ කාර්ය මූලික පර්යේෂණයක්.
(දෙනුවර අධ්‍යාපන කලාපය)
**එන්.ඩී. හපුගොඩ හා ජී.එච්.එන්.බෙගම්**

විමසුම් පාදක ඉගෙනීම විද්‍යා විෂය සාධනය කෙරෙහි කරනු ලබන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්
**නිරංජලා වික්‍රමතිලක**

පාසල් පුස්තකාල ඉගෙනුම් සම්පත් සම්පත් මධ්‍යස්ථානය, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා දායක කර ගැනීමෙන් ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම.
(මධ්‍යම පළාත් විල්ගමුව අධ්‍යාපන කලාපයේ 1-ක් වර්ගයේ පාසලක් වන මිණිපුර විජය මහා විද්‍යාලයේ 9, 10 ශ්‍රේණිවල සිසුන් 40 කගේ නියැදියක් ඇසුරිනි.)
**එන්.ජී.රුවන් ජයසේකර, ආර්.එම්.බී.ජී. අතුල සමන් කුලංතුංග, ජී.ජේ.වසුන්දරා ලෙනගල**

ළමා කතා සාහිත්‍යය කෘති ඇගයීමට අදාළ ජාතික මට්ටමේ නිර්ණායක ලේඛනයක් සැකසීම පිළිබඳ අධ්‍යයනයක්
**පී.ජී.ප්‍රේමදාස**

ළමා කෘතියක් නිර්මාණය පිළිබඳ ලේඛක ප්‍රත්‍යවේක්ෂණයක්
**තනූජා එන්. අයගම**

කතන්දර සිතියමක් භාවිතයෙන් ළමා කතා කියවීම විෂය සාධනයට බලපාන ආකාරය පිළිබඳ කාර්ය මූලික පර්යේෂණයක්
(කෑ/බෝයගම මහා විද්‍යාලයේ හතර ශ්‍රේණියේ සිසුන් ඇසුරිනි)
**ආර්.ඒ.පී.රත්නායක**

නිවස තුළ ඉගෙනුම් හා කියවීම් පරිසරයක් නිර්මාණය කර ගැනීම සඳහා ගෘහස්ථ පුස්තකාල (Home Libraries) ස්ථාපනය කිරීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.
**නිලූකා හර්ෂණී**

බිලූම්ගේ වර්ගීකරණයට අනුව පින්තූර කියවීම පිළිබඳ අධ්‍යයනයක්.
**එම්.ජේ.සී. හේමලතා, කේ.එල්.වී. සමන්ති, එම්.වී.නිලූකා දිල්රුක්ෂි කරුණාසේන, පී.කේ. චන්ද්‍රසේකර**

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා වෙබ් 2.0 භාවිතය
**අසිත සඳරුවන්**

අන්තර්ජාලය ඉගෙනුම් උපකරණයක් ලෙස භාවිත කිරීමට අදාළ ගුරු පුහුණු වැඩසටහන් පිළිබඳ ඇගයීමක් (මීගමුව අධ්‍යාපන කලාපය ඇසුරින්)
**ගාමිණී ප්‍රනාන්දු**

විද්‍යුත් මාධ්‍ය තොරතුරු ගවේෂණයට අදාළ ගුරු පුස්තකාලායාධිපති පුහුණු වැඩසටහන් පිළිබඳ අධ්‍යයනයක්
(2012 වර්ෂය තුළ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පවත්වන ලද පුහුණු වැඩසටහන්වලට සහභාගී වූ ගුරු/පාසල් පුස්තකාලයාධිපතීන් ඇසුරින්)
**ගීතා රමණී**

ඉ-තක්සලාව ගුරු ආදර්ශයක් ලෙස භාවිත කිරීම පිළිබඳ සමීක්ෂණයක්
(මො/බිබිල මහාමාත්‍ය විද්‍යා විද්‍යාලයේ 4 ශ්‍රේණිය ඇසුරින්)
**එම්.එම්.ඒ.හේරත් මැණිකේ**

**පහත සඳහන් මාතෘකා යටතේ පෝස්ටර් 07ක් ඉදිරිපත් කෙරිණි.**

ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍යවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලයට භාර දෙන ලද පශ්චාත් උපාධි නිබන්ධ සහ සිද්ධි ග්‍රන්ථවල සන්දර්භ විශ්ලේෂණයක්
**චාන්දනී කරුණාසේකර**

ෆොස්ෆීන් ධූමායනයට එරෙහිව කාමින්ගේ ප්‍රතිරෝධය වර්ධනය වීම
**එල්.එම්. උදය කබ්රාල්, පැස්කල් ක්වර්කනර්**

උභතෝකෝටිකත්වයට මුහුණ දීමෙන් තොරව youtube භාවිතා කරන ආකාරය
**පූජිත හේවාවසම්, අනූෂා අබේවර්ධන, ඩිලානි අබේරත්න, සී.ජී.නිශාන්ත, පී.කේ. ජයසේකර, අයෝනි පෙරේරා**

උපාධි අපේක්ෂකයන් විසින් මාර්ගගත සඟරා භාවිත කිරීම : ශ්‍රී ලංකාවේ රජරට විශ්වවිද්‍යාලයේ කෘෂි පීඨය මත පදනම් වූ සිද්ධි අධ්‍යානයක්.
**ඩබ්ලිව්.පී.ටී. දිල්රුක්ෂි**

රුහුණු විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාල තුළ නීතිමය තැන්පතු එකතුව ස්ථාපිත කිරීම
**පී.කේ.ජයසේකර, ආර්.ඒ.පී.එස්.සෙනෙවිරත්න, පී.ජී.නිශාන්ත, යූ.ඒ.ලාල්**

වෙබ් 2.0 මෙවලම් හඳුනා ගැනීම හා සමාජ ජාල වෙබ් අඩවි භාවිතයෙන් නව ඉගැනුම් ඉගැන්වීම් ප්‍රවේශයන් හඳුනා ගැනීම
**අසිත සඳරුවන් ජයසූරිය**
ගූගල් ඩොක් සහ MS වර්ඩ් පිළිබඳ සැසඳීමක්
**එච්.ඒ.පී..කුලතුංග, එස්.අයි.එම්. ඉම්තියාස්, කේ.ජයසූරිය, එස්.බෙනරගම**

## බාහිර අයතන සඳහා සම්පත් දායකත්වය

- අධ්‍යක්ෂ ආර්.බී.ජී.රණවීර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් වන පී.ජී.ජේමදාස සහ ආචාර්ය රුවන් ගමගේ සහ සහකාර පුස්තකාලයාධිපති උදිත අලහකෝන් කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අවසන් වසරේ පුස්තකාල හා තොරතුරු කළමනාකරණය යන මොඩියුලය සඳහා සම්පත් දායකත්වය දැක්වූහ.

- පී.ජී.ජේමදාස (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය) මධ්‍යම පළාතේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව අනුග්‍රහයෙන් 2014 වර්ෂයේදී පවත්වන ලද විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් පුහුණු කිරීමේ විශේෂ වැඩසටහනෙහි ප්‍රධාන සම්පත් දායකත්වය දැරීය. මේ අනුව දෙනුවර (2014.02.17), මාතලේ (2014.02.18) මහනුවර (201402.24), කටුගස්තොට (2014.02.25) නුවරඑළිය (2014.03.03, 04), හැටන් (2014.03.11), කොත්මලේ (2014.03.17), ගම්පොල (2014.07.31), විල්ගමුව (2014.04.01), ගලේවෙල (2014.04.28), හඟුරන්කෙත (2014.04.29). තෙල්දෙණිය (2014.05.06), ගම්පොල සහ කොත්මලේ (2014.05.12) යන මධ්‍යම පළාතේ සියලුම අධ්‍යාපන කලාප ආවරණය කරන ආකාරයට මෙම වැඩසටහන දියත් කෙරිණි. මෙම වැඩසටහන් මාලාව සඳහා විදුහල්පතිවරුන් සහ ගුරුපුස්තකාලයාධිපතීන් 680 ක් සහභාගී වී ඇත.

**<u>ආචාර්ය රුවන් ගමගේ / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය</u>**

- 2014.06.28 - 29 දක්වා APITT ආයතනයේ පැවති පාසල් පුස්තකාලයාධිපතීන් සඳහා වැඩමුළුවේ සම්පත් දායකත්වය.

- කොළඹ බිෂොප් විද්‍යාලයේ 2014.07.25 පැවති සම්මන්ත්‍රණයේදී තොරතුරු මූලාශ්‍ර උපුටා දැක්වීම් සහ ලේඛන චෞරත්වය සහ අන්තර්ජාලයේ අන්ත්‍රාවන් සහ මැයෙන දේශනයක් පැවැත්වීම.

- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේදී 2014.08.21 එහි අධ්‍යයන කාර්ය මණ්ඩලයට 'ඉලෙක්ට්‍රොනික තොරතුරු සමුද්ධරණය' යන මැයෙන් දේශනයක් පැවැත්වීම.

උදිත අලහකෝන්

- 2014.02.06 -07 වයඹ පළාතේ මහජන පුස්තකාලයාධිපතීන් සඳහා කුරුණෑගල මහජන පුස්තකාලයේ පැවති පුහුණු වැඩසටහනේදී වර්ගීකරණය. සුචිකරණය සහ තොරතුරු මධ්‍යස්ථානයෙහි කාර්ය භාරය යන අංශ යටතේ සම්පත් දායකත්වය සැපයීම.

- 2014.06.28-29 සහ 2014.07.21 -22 උතුරු මැද පළාතේ මහජන පුස්තකාලයාධිපතින් සඳහා පැවති වැඩමුළුවේදී වර්ගීකරණය හා සුචිකරණය අංශ සඳහා සම්පත්දායකත්වය සැපයීම.

- 2014.03.24 ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ජාතික ග්‍රන්ථ විඥාපන සේවා අංශය සංවිධානය කළ බස්නාහිර පළාත් මහජන පුස්තකාලයාධිපතීන් සඳහා වූ ඩිවිදශම වර්ගීකරණය පිළිබඳ වැඩමුළුවේ ප්‍රධාන සම්පත්දායකයා ලෙස කටයුතු කිරීම.

- 2014.06.30 ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ජාතික ග්‍රන්ථවිඥාපන අංශය සංවිධානය කළ බස්නාහිර පළාත් මහජන පුස්තකාලයාධිපතීන් සඳහා වූ සුචිකරණය වැඩමුළුවේ ප්‍රධාන සම්පත්දායකයා වීම.

- 2014.09.05 පැවති වයඹ පළාතේ මහජන පුස්තකාලයාධිපතීන් සඳහා වූ ඩිවිදශම වර්ගීකරණය වැඩමුළුවේ ප්‍රධාන සම්පත් දායකයා වීම.

- 2014.11.25 ගාල්ල දිස්ත්‍රික්කයේ මහජන පුස්තකායාධිපතීන් සඳහා වූ ඩිවිදශම වර්ගීකරණය වැඩමුළුවේ ප්‍රධාන සම්පත් දායකයා වීම.

## අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පර්යේෂණ දායකත්වය

### ප්‍රකාශන

ආර්.පී.පී.රණවීර මහතා /අධ්‍යක්ෂ

- 2014 නොවැම්බර් 4 සහ 5 මැලේසියාවේ පැවති අන්තර්ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා සම්මන්ත්‍රණ ප්‍රකාශනයෙහි ඒ.වී.ඩී.කුමාර සහ ජී.ඩී.එම්.එන්.සමන්දිවාකර සමඟ එක්ව ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි සිසුන්ගේ ඩිජිටල් තොරතුරු සාක්ෂරතාව වෙත සමාජ සංස්කෘතික ප්‍රවේශයක් යනුවෙන් පර්යේෂණ පත්‍රිකාවක් පළ කිරීම.

- 2014 නොවැම්බර් 19 දින කොළඹ ගලදාරි හෝටලයේ පැවති පුස්තකාල හා විඥාපන විද්‍යා ජාතික සම්මන්ත්‍රණ ප්‍රකාශනයෙහි පී.ජී.පේමදාස, රුවන් ගමගේ සහ උදිත අලහකෝන් සමඟ එක්ව කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ සිසුන්ගේ තොරතුරු කුසලතා සංවර්ධනය සඳහා ගූගල් ඩ්‍රයිව් භාවිත කිරීම මැයෙන් පත්‍රිකාවක් පළ කිරීම.

ආචාර්ය රුවන් ගමගේ /ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පියදාස රණසිංහ මහතා වෙනුවෙන් පළ කරන ලද කෘතවේදී ලිපි සංග්‍රහය සඳහා ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රොනික පුස්තකාල පිළිබඳ පෞද්ගලික ඉතිහාසයක් 2000-2014 මැයෙන් ලිපියක් පළ කිරීම.

- පංති කාලසටහන් සඳහා ගූගල් ඩ්‍රයිව් භාවිතය මැයෙන් 2014 NILIS පර්යේෂණ සම්මන්ත්‍රණයට ඉදිරිපත් කරන ලද පත්‍රිකාව එහි සම්මන්ත්‍රණ සැසි වාර්තාවේ පළ කිරීම.

- 2014 NILIS පර්යේෂණ සම්මන්ත්‍රණ ප්‍රකාශනයේ සංස්කාරකවරයෙකු ලෙස කටයුතු කිරීම.

පී.ජී.ප්‍රේමදාස /ජ්‍යෙෂ්ඨ කථාකාචාර්ය

- 2014 NILIS පර්යේෂණ සම්මන්ත්‍රණ ප්‍රකාශනයෙහි ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම සඳහා සම්පත් පාදක ඉගැන්වීමේ බලපෑම පිළිබඳ අධ්‍යනයක් (මධ්‍යම පළාතේ කලාප 15 න් තොරාගත් පාසල් අසුරින්) මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් පළ කිරීම.

- 2014 NILIS පර්යේෂණ සම්මන්ත්‍රණ ප්‍රකාශනයෙහි ළමා කතා සාහිත්‍ය කෘති ඇගයීමට අදාළ ජාතික මට්ටමේ නිර්ණායක ලේඛනයක් සැකැස්ම පිළිබඳ අධ්‍යයනයක් මැයෙන් තේමා පත්‍රිකාවක් පළ කිරීම.

- 2014 නොවැම්බර් 19 දින කොළඹ ගලදාරී හොටලයේ පැවති පුස්තකාල හා විඥාපන විද්‍යා ජාතික සමමන්ත්‍රණ ප්‍රකාශනයෙහි ආර්.පී.පී.රණවීර, රුවන් ගමගේ සහ උදිත අලහකෝන් සමඟ එක්ව කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ සිසුන්ගේ තොරතුරු කුසලතා සංවර්ධනය සඳහා ගූගල් ඩ්‍රයිව් භාවිත කිරීම මැයෙන් පත්‍රිකාවක් පළ කිරීම.

- 2014 NILIS පර්යේෂණ සමමන්ත්‍රණ ප්‍රකාශනයේ සංස්කාරවරයෙකු ලෙස කටයුතු කිරීම.

උදිත අලකෝන් /සහකාර පුස්තකාලයාධිපති

- 2014 NILIS පර්යේෂණ සම්මන්ත්‍රණ ප්‍රකාශනයේ 2013 වසරේ ශ්‍රී ලංකාවේ සිංහල භාෂාමය ප්‍රකාශනවල විෂය විවිධත්වය පිළිබඳ ප්‍රමාණාත්මක අධ්‍යයනයක් මැයෙන් පර්යේෂණ ලිපියක් පළ කිරීම.

- 2014 නොවැම්බර් 19 වන දින කොළඹ ගලදාරී හොටලයේ පැවති පුස්තකාල හා විඥාපන විද්‍යා ජාතික සම්මන්ත්‍රණ ප්‍රකාශනයෙහි ආර්.පී.පී.රණවීර, රුවන් ගමගේ සහ උදිත අලහකෝන් සමඟ එක්ව කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ සිසුන්ගේ තොරතුරු කුසලතා සංවර්ධනය සඳහා ගූගල් ඩ්‍රයිව් භාවිතා කිරීම මැයෙන් පත්‍රිකාවක් පළ කිරීම.

- මහාචාර්ය ජොනතන් ඩිල්ගේ ආචාර්ය උපාධි නිබන්ධය ඇසුරින් පළ කරන ලද Reading Challenge කෘතිය අවිඥානයේ ෆැන්ටසිමය අවකාශය : හරුකි මුරකමි නිර්මාණ විමසුම නමින් පරිවර්තනය කර පළ කිරීම.

- විදේශීය විකල්ප චිත්‍රපට 50ක් පිළිබඳ විචාර ඇතුළත් කෘතියක් මායාව විනිවිදින ගෝලීය සිනමාව නමින් පළ කිරීම.

- ටී.එස්.තිරුමූර්ති නම් ඉන්දීය ලේඛකයාගේ chennaivasi නවකතාව සුන්දාරි නමින් පරිවර්තනය කර පළ කිරීම.

## බාහිර ආයතනවල කමිටු සාමාජිකත්වය

<u>ආර්.පී.පී.රණවීර මහතා /අධ්‍යක්ෂ</u>

- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යාපන අංශයේ උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම.

<u>ආචාර්ය රුවන් ගමගේ /ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය</u>

- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ උපදේශන කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම.

- ජාතික විද්‍යා පදනමේ ඩිජිටල්කරණ ව්‍යාපෘතියේ අධීක්ෂණ කමිටු සාමාජිකයෙකු වීම.

<u>උදිත අලහකෝන් / සහකාර පුස්තකාලයාධිපති</u>

- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ග්‍රන්ථ විඥාපන උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම.
- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ජාතික සාධිකාරී ලේඛන (කර්තෘ, ග්‍රන්ථනාම සහ ආයතන) සම්පාදන කමිටුවල සාමාජිකත්වය දැරීම.
- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්ති සම්පාදන කමිටුවේ සාමාජිකයෙකු වීම.
- කොළඹ මහජන පුස්තකලයේ උපදේශන කමිටුවේ සාමාජිකයෙකු වීම.

## ඇගයීම්

ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපන ක්ෂේත්‍රයට කරන ලද උසස් දායකත්වය වෙනුවෙන් 2014 වර්ෂයේ දී ජාතික හා ප්‍රෙල්ඛන සේවා මණ්ඩලය විසින් ජාතික පුස්තකාල සම්ප්‍රසාදන සම්මානය ජාතික පදනමේ පැවති විශේෂ උත්සවයකදී NILIS ආයතනයට ප්‍රදානය කරන ලදී.

## 1. පාඨමාලාවන් පිළිබඳ විස්තර

| පාඨමාලාව | සිසුන්ගේ මුළු එකතුව | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මුළු එකතුව | අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මුළු එකතුව |
|---|---|---|---|
| දර්ශනපති/දර්ශනශූරි | 14 | බා.05<br>ස්.02 | 01 |
| පුස්තකාල හා විඥාපන විද්‍යා ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව- පූර්ණ කාලීන | 17 | බා.11<br>ස්.03 | 01 |
| තොරතුරු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව - පූර්ණ කාලීන | 10 | බා.10<br>ස්.02 | 01 |
| ගුරු පුස්තකාලයාධිපති උපාධි පාඨමාලාව –පූර්ණ කාලීන | 18 | බා.08<br>ස්.03 | 01 |
| තොරතුරු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව - පූර්ණ කාලීන | 10 | බා.15<br>ස්.03 | 01 |
| තොරතුරු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව - අර්ධ කාලීන | 17 | බා.05<br>ස්.02 | 01 |
| ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව - පූර්ණ කාලීන | 05 | බා.10<br>ස්.03 | 01 |
| පුස්තකාල හා තොරතුරු විඥාපන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව - අර්ධ කාලීන | 59 | බා.10<br>ස්.03 | 01 |
| පාසල් පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 71 | බා.4<br>ස්. 1 | 01 |
| මහජන පුස්තකාලයාධිපතීත්වය පිළිබඳඩිප්ලෝමා පාඨමාලාව | 08 | බා.8<br>ස්.03 | 01 |
| පුස්තකාල හා තොරතුරු කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 12 | බා.2<br>ස්. 03 | 01 |
| පුස්තකාල හා තොරතුරු කළමනාකරණය පිළිබඳ ප්‍රථම සහතික පත්‍ර පාඨමාලාව | 37 | බා. 8<br>ස්.3 | 01 |
| මහජන පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 09 | බා.7<br>ස්.04 | 01 |
| පාසල් පුස්තකාලයාධිපතීත්වය පිළිබඳසහතික පත්‍ර පාඨමාලාව | 20 | බා. 10<br>ස්.03 | 01 |
| අධ්‍යාපනවේදී උපාධිය (3 කොටස)<br>පුස්තකාල හා තොරතුරු කළමනාකරණය (සිංහල මාධ්‍ය) | 51 | ස්.03 | 01 |
| අධ්‍යාපනවේදී උපාධිය (3 කොටස)<br>පුස්තකාල හා තොරතුරු කළමනාකරණය (ඉංග්‍රීසි මාධ්‍ය) | 19 | ස්.03 | 01 |

* ස්. ස්ථිර කථිකාචාර්යවරුන්

* බා. බාහිර කථිකාචාර්යවරුන්

## 2. විදේශ සිසුන් පිළිබඳ විස්තර

| පාඨමාලාවේ නම | මාධ්‍යය | 2013 වර්ෂයේ ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව | පළමු වර්ෂයේ සිසුන් සංඛ්‍යාව | දෙවන වර්ෂයේ සිසුන් සංඛ්‍යාව | තෙවන වර්ෂයේ සිසුන් සංඛ්‍යාව | සිව්වන වර්ෂයේ සිසුන් සංඛ්‍යාව | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| තොරතුරු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව - පූර්ණ කාලීන | ඉංග්‍රීසි | 04 | | | | | |

## 3. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

- **අධ්‍යක්ෂ - එම්.එස්.යූ.අමරසිරි (2014.02.22 දක්වා)**
- **අධ්‍යක්ෂ - ආර්.පී.පී.රණවීර (2014.02.23 සිට)**

| විෂය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | සහකාර කථිකාචාර්ය | උපදේශක | විෂය |
|---|---|---|---|---|---|---|---|---|
| අධ්‍යාපන විද්‍යාව | ඉංග්‍රීසි /සිංහල | | | | පී.ජී. පේමදාස මහතා | - | - | - |
| පුස්තකාල විද්‍යාව | ඉංග්‍රීසි/සිංහල | | | | ආ.ර්.පී.පී රණවීර මහතා | - | - | - |
| තොරතුරු තාක්ෂණය | ඉංග්‍රීසි/සිංහල | | | | ආචාර්ය රුවන් ගමගේ මහතා | - | - | - |
| **සහකාර පුස්තකාලයාධිපති යූ.පී. අලහකෝන් මහතා** | | | | | | | | |

## 4. පරිපාලන කාර්ය මණ්ඩලයේ විස්තර

| අංශය | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | කණිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුළු සේවකයන් |
|---|---|---|---|
| පරිපාලන | ඒ.අබේරත්න මිය<br>සහකාර ලේඛකාධිකාරි | ඒ.එන්.එල්.නාමලී මිය,<br>ලිපිකරු II ශ්‍රේණිය<br><br>එන්.කේ.කුරුප්පුආරච්චි මහතා<br>පරිගණක යෙදවුම් සහකාර III ශ්‍රේණිය<br><br>ටී.එච්.ආර්.බී.චන්ද්‍රතිලක මිය<br>පරිගණක යෙදවුම් සහකාර III ශ්‍රේණිය | ඒ.ඒ.ජේ. අබේසිංහ<br><br>රියදුරු |
| මූල්‍යය | එච්.වී.එස්.එම්.ජයසේකර මිය<br><br>ජ්‍යෙෂ්ඨසහකාර මූල්‍යාධිකාරි | එස්.ඒ.ඩී.ටී.එන්.රත්නායක<br>පොත් තබන්නා II ශ්‍රේණිය | |
| පුස්තකාලය | | බී.පී. වෙත්තසිංහ මිය<br>පුස්තකාල සහකාර III ශ්‍රේණිය | |

## 5. පර්යේෂණ ප්‍රකාශන පිළිබඳ විස්තර

| විෂය | ප්‍රකාශිත | වාණිජමය | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| (අ) පර්යේෂණ සංඛ්‍යාව | 02 | | 21 පර්යේෂණ නිබන්ධ සහ ව්‍යාපෘති වාර්තා |
| (ආ) නව සොයාගැනීම් සංඛ්‍යාව | | | |
| (ආ) සඟරා සංඛ්‍යාව | 04 | | |
| (ඇ) පොත් සංඛ්‍යාව | | | |
| (ඇ) ලිපි සංඛ්‍යාව | 24 | | |
| (උ) වෙනත් | | | |
| එකතුව | 30 | | 21 |

**6.**

## I. වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර

| විෂය | | සම්පූර්ණ කරන ලද | දැනට පවතින |
|---|---|---|---|
| a. පශ්චාත් උපාධි පාඨමාලා ගණන<br>දර්ශනපති/දර්ශනශූරී 02. තොරතුරු කළමනාකරණ 01. පුස්තකාල හා විඥාපන විද්‍යා 02. ගුරුපුස්තකාලයාධිපති (පූර්ණ කාලීන) 01. ගුරු පුස්තකාලයාධිපති(අර්ධ කාලීන) 01 | 09 | 03 | 06 |
| b. පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා ගණන | 08 | 03 | 05 |
| c. උපාධි පාඨමාලා ගණන | - | - | - |
| d. ඩිප්ලෝමා පාඨමාලා ගණන | 05 | 02 | 03 |
| e. සහතික පත්‍ර පාඨමාලා ගණන | 06 | 04 | 02 |
| f. වෙනත්<br>වැඩමුළු සහ සම්මන්ත්‍රණ | | | |
| එකතුව | 28 | 12 | 16 |

## II. ලැබූ සම්මාන පිළිබඳ විස්තර:

| විෂය | | විද්වතුන් සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| a. දේශීය සම්මාන | | | |
| b. ජාතික සම්මාන | 01 | | |
| c. ජාත්‍යන්තර සම්මාන | | | |
| d. වෙනත් | | | |
| **එකතුව** | **01** | | |

## ii. වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර

| විෂය | පාඨමාලාලාභීන් ගණන |
|---|---|
| පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ වැඩසටහන (27.11.2013- 07.02.2014) | 33 |
| ඩිජිටල් පුස්තකාල පිළිබඳ වැඩමුළුව (15.03.2014) | 21 |
| කාර්යාල කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ පුහුණු පාඨමාලාව (03.04.2014-05.06.2014) | 16 |
| කාර්යාල කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ පුහුණු පාඨමාලාව (04.09.2014-16.10.2014) | 17 |
| NILIS සම්මන්ත්‍රණය 2014 (21.11.2014) | 126 |
| MPhil/PhD සම්මේලනය (22.11.2014) | 26 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , දෙනුවර අධ්‍යාපන කලාපය (17.02.2014) | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , මාතලේ අධ්‍යාපන කලාපය (18.02.2014) | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , මහනුවර අධ්‍යාපන කලාපය (24.02.2014) | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , කටුගස්තොට අධ්‍යාපන කලාපය (25.02.2014) | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , නුවරඑළිය අධ්‍යාපන කලාපය (03.03.2014) | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , නුවරඑළිය අධ්‍යාපන කලාපය (04.03.2014) | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , හෝටන් අධ්‍යාපන කලාපය(11.03.2014) | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , කොත්මලේ අධ්‍යාපන කලාපය (17.03.2014) | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , ගම්පල අධ්‍යාපන කලාපය (18.03.2014) | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , වපලනේ අධ්‍යාපන කලාපය (24.03.2014) | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , වලපනේ අධ්‍යාපන කලාපය (25.03.2014) | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , නාඋල අධ්‍යාපන කලාපය (31.03.2014) | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , වැලිගමුව අධ්‍යාපන කලාපය (01.04.2014) | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , ගලේවෙල අධ්‍යාපන කලාපය Zone(28.04.2014) | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , හඟුරන්කෙත අධ්‍යාපන කලාපය (29.04.2014) | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , තෙල්දෙණිය අධ්‍යාපන කලාපය (06.05.2014) | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , ගම්පල/කොත්මලේ අධ්‍යාපන කලාපය (12.05.2014) | 40 |

## 8. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

| විෂය | 2013Rs. | 2014Rs. |
|---|---|---|
| 1. පෞද්ගලික සංවේතන | 13,148,980 | 13,671,862 |
| 2. ගමන් | 14,887 | 18,729 |
| | | |
| | | |
| | | |
| 3. සැපයුම් | 927,175 | 703,985 |
| 4. නඩත්තු | 501,345 | 592,686 |
| 5. ගිවිසුම් සේවා | 1,634,670 | 1,352,992 |
| 6. වෙනත් | 1,988,667 | 1,539,431 |
| එකතුව | | |

## 9. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

| විෂය | 2013 රු. | 2014 රු. |
|---|---|---|
| 1. ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ පවරා ගැනීම | 956,770 | 962,502 |
| 2. යන්ත්‍ර පවරා ගැනීම | 1,647,500 | 1,162,051 |
| 3. ගොඩනැගිලි සහ ව්‍යුහය පවරා ගැනීම | 398,147 | 179,082 |
| 4. වෙනත් | 199,925 | 496,693 |
| එකතුව | **3,202,342** | **2,800,328** |

**1 වගුව - දර්ශනපති ආචාර්ය /උපාධි**

| | ශිෂ්‍යයාගේ නම | නිබන්ධනයේ මාතෘකාව | අධීක්ෂකගේ නම |
|---|---|---|---|
| 01 | සී.එන්. අලහකෝන් | ශ්‍රී ලංකාවේ තෝරාගත් විශ්වවිද්‍යාලවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ භාවිතය පිළිබඳ තත්ව විශ්ලේෂණයක් | ආචාර්ය සී.සී.ජයසුන්දර<br>ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 02 | එච්.පී.එස්.ඩී.ගුණසේකර | විවෘත හා දුරස්ථ ඉගෙනුම් සම්පත්වල භූමිකාව : ශ්‍රී ලාංකීය පර්යාලෝකයක් | මහාචාර්ය ජී.අයි.සී. ගුණවර්ධන |
| 03 | ටී.එන්.නෙයිසුරි | ඉලෙක්ට්‍රොනික පුරවැසියන් බවට පරිවර්තනය වීමේ දී ඉලෙක්ට්‍රොනික රාජ්‍ය පාලනය සහ පුස්තකාල සේවාවන්ගේ භූමිකාව හා සමෝධානය | මහාචාර්ය එන්.ඩී. කොඩිකාර කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය<br>ආචාර්ය වත්මානෙල් සෙනෙවිරත්න<br>පුස්තකාලයාධිකාරී<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| 04 | එම්.ඩී.ආර්.කුමුදිනී | ශ්‍රී ලංකාවේ තොරතුරු ගවේෂණ චර්යාව සහ විදේශීය ප්‍රමිති | ආචාර්ය රුවන් ගමගේ<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 05 | එස්.එම්. විජේසිංහ | ජ්‍යෙෂ්ඨ ද්විතියික අවධියේ පාසල් සිසුන් සහ එම අවධියේ සිසුන්ට උගන්වන ගුරුවරුන්ගේ පාසල් පුස්තකාල භාවිතය පිළිබඳ අධ්‍යයනයක් | ආචාර්ය ඒ.ඒ. ජයවර්ධන<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>අධ්‍යාපන පීඨය<br>කොළඹ විශ්වවිද්‍යාලය |

## 2 වගුව - පුස්තකාල හා තොරතුරු විද්‍යා ශාස්ත්‍රපති පාඨමාලාව (MLS)

| | ශිෂ්‍යයාගේ නම | නිබන්ධනයේ මාතෘකාව | අධීක්ෂකගේ නම |
|---|---|---|---|
| 01 | කේ.කේ.එන්.එල්.පෙරේරා | ශාස්ත්‍රීය පුස්තකාලවල වින්දනාත්මක කියවීම් අවශ්‍යතා : කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය ඇසුරින් සිද්ධි අධ්‍යයනයක් | පී.ජී.ප්‍රේමදාස, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 02 | එන්.ඩී.සී.වීරසේකර | අන්තර්ජාතික ශාස්ත්‍රීය සඟරාවල පර්යේෂණ ලිපි පළ කිරීමේදී සමාජ විද්‍යාඥයන් මුහුණ දෙන අභියෝග පිළිබඳ අධ්‍යයනයක් | ආචාර්ය රුවන් ගමගේ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය |

## 3 වගුව - පුස්තකාල හා තොරතුරු විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGLIS)

| | ශිෂ්‍යයාගේ නම | නිබන්ධනයේ මාතෘකාව | අධීක්ෂකගේ නම |
|---|---|---|---|
| 01 | බී.ට්‍රෙවින් බැස්ටියන් | විදූ පියස පුහුණු පාඨමාලාව වෙත ශ්‍රී ලංකා මහ බැංකු පුස්තකාලයේ තොරතුරු සේවා කරනු ලබන දායකත්වය පිළිබඳ අධ්‍යයනයක් | උදිත අලහකෝන්<br>සහකාර පුස්තකාලයාධිපති, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 02 | එස්.එස්.වීරසිංහ | ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා එකතුව සහ එහි භාවිතය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් | උදිත අලහකෝන්<br>සහකාර පුස්තකාලයාධිපති, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 03 | බී. සෞම්‍යා උපමාලිකා | පළතුරු බෝග පර්යේෂණ සඳහා විද්‍යුත් මූලාශ්‍ර භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | සී.අලහකෝන්, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| 04 | ජී.කේ.එස්.පෙරේරා | පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පශ්චාත් උපාධි නිබන්ධනය පිළිබඳ ග්‍රන්ථිමිතික අධ්‍යයනයක් | ජී.ඩී.එම්.එන්.සමරදිවාකර, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ |
| 05 | බී.එස්.එම්.අබේවික්‍රම | ශ්‍රී ලංකාවේ නවකතා ග්‍රන්ථ ප්‍රකාශනය කෙරෙහි ස්වර්ණ පුස්තක සම්මාන ප්‍රදානය කරනු ලබන බලපෑම පිළිබඳ විමසුමක් | උදිත අලහකෝන්<br>සහකාර පුස්තකාලයාධිපති, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 06 | එස්.උදේනි විජේතිලක | විශ්වවිද්‍යාල සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා ජාතික පුස්තකාලයේ තොරතුරු සම්පත් භාවිතය පිළිබඳ අධ්‍යයනයක් | වරුණි ගහබඩආරච්චි, ප්‍රධාන පුස්තකාලයාධිපති, මහජන පුස්තකාලය, කොළඹ |
| 07 | ඩබ්.ඩබ්.පී.එන්. ගීකියනගේ | පුස්තකාලයේ තොරතුරු කළමනාකරණය කිරීම සඳහා තොරතුරු සම්පත් භාවිතය පිළිබඳ අධ්‍යයනයක් | ජී.ඩී.එම්.එන්.සමරදිවාකර, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්කතාලයාධිපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ |

| | | | |
|---|---|---|---|
| 08 | එන්.කුමාරි දහනායක | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ පශ්චාත් උපාධි අපේක්ෂකයන්ගේ විද්‍යුත් මාධ්‍ය භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | පී.කේ.පෙරේරා, පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය, මාලබේ |
| 09 | ඩබ්ලිව්.සී.කොඩිතුවක්කු | ALIIT ආයතනයේ සිසුන් අධ්‍යයන කටයුතු සඳහා මුහුණුපොත භාවිත කරන ආකාරය පිළිබඳ අධ්‍යනයක් | ජාවඩ් අසාන්, කථිකාචාර්ය, ආසියා පැසිෆික් තොරතුරු තාක්ෂණ ආයතනය. |
| 10 | මල්මි ඒකනායක | පාසල් පුස්තකාල මගින් සිසුන්ගේ සිංහල භාෂා සාධනය ඉහළ නැංවීම පිළිබඳ කරනු ලබන පර්යේෂණයක් (ලයිසියම් ජාත්‍යන්තර පාසල ඇසුරින්) | ආර්.පී.පී.රණවීර, අධ්‍යක්ෂ, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 11 | කේ.එස්.ගුණසේකර | පාසල් සිසුවියන්ගේ පැවරුම් සම්පූර්ණ කිරීම සඳහා පුස්තකාල භාවිතා කරන ආකාරය පිළිබඳ අධ්‍යයනයක් (මියුසියස් විද්‍යාලයේ 8 ශ්‍රේණියේ සිසුවියන් ඇසුරෙන්) | උදිත අලහකෝන් සහකාර පුස්තකාලයාධිපති, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 12 | එන්.කේ.විජේතුංග | ජල සැපයුම ව්‍යාපෘති විසින් සිදු කරන ක්‍රියාකාරකම්වලට පුස්තකාල සම්පත්වල දායකත්වය පිළිබඳ අධ්‍යයනයක් | ආචාර්ය.ඩබ්ලිව්.කේ.වීරගොඩ, ප්‍රධාන ඉංජිනේරු, ජල සැපයුම් ව්‍යාපෘතිය, මනුවර |
| 13 | ඩී.සනිආයා විතානවසම් | ආර්ථික හා සංඛ්‍යාන පර්යේෂණ කටයුතුවලදී ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන පුස්තකාලයේ කාර්ය භාරය පිළිබඳ අධ්‍යයනයක් | කේ.ජී.ජී.ඩබ්.විජේවීර, පුස්තකාලයාධිපති, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, ශික්ෂණ රෝහල, පේරාදෙණිය |
| 14 | ඩබ්.එම්.අයි.එම්.විජේසුන්දර | ශ්‍රී ලංකාව තුළ සිංහල භාෂාවෙන් පළ වූ ළමා කෘති පිළිබඳ ග්‍රන්ථමිතික අධ්‍යයනයක් (2012 සහ 2013 වර්ෂවල පළ වූ ළමා කෘති ඇසුරින්) | උදිත අලහකෝන් සහකාර පුස්තකාලයාධිපති, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 15 | ආර්.එම්.ආර්.දියලගෙදර | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට අනුබද්ධ සන්නද්ධ සේවා නිලධාරීන්ගේ පුස්තකාල භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | ආචාර්ය රුවන් ගමගේ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 16 | බී.වී.ආර්.ජී.ජී. රාලහාමි | පුස්තකාල සම්පත් භාවිතයෙන් භූගෝල විද්‍යා විෂය ඉගැන්වීම පිළිබඳ කාර්යමූලික පර්යෙෂණයක් (කෑ/බණ්ඩාරනායක මහ විදුහලේ 8 ශ්‍රේණියේ සිසුන් ඇසුරින්) | පී.ජී.ප්‍රේමදාස, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය |

## 4 වගුව - ගුරු පුස්තකාල ශාස්ත්‍රපති පාඨමාලාව (MTL)

| | ශිෂ්‍යයාගේ නම | නිබන්ධනයේ මාතෘකාව | අධීක්ෂකගේ නම |
|---|---|---|---|
| 01 | ඩී.අනුලා කුමාරිහාමි | පාසල් සිසුන්ගේ සන්නිවේදන කුසලතා වැඩිදියුණු කිරීම සඳහා ගුවන්විදුලි මාධ්‍යය යොදා ගත හැකි ආකාරය පිළිබඳ අධ්‍යයනයක්. (අනුරාධපුර රජරට ගුවන් විදුලි සේවය සහ දීපානි මහා විද්‍යාලයේ සිසුන් ඇසුරින්) | උදිත අලහකෝන් සහකාර පුස්තකාලයාධිපති, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 02 | එච්.ජේ.ජේ.හේරත් | තොරතුරු ගවේෂණ කුසලතා වර්ධනය සඳහා පාසල් පුස්තකාල ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයේ සිදු කරනු ලබන වැඩසටහන් පිළිබඳ ඇගයීමක්. | ආචාර්ය රුවන් ගමගේ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 03 | ටී.එච්.සී.ජයමි ද සිල්වා | ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන්ගේ කියවීම් ප්‍රවර්ධනය සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳ ඇගයීමක් (අම්බලන්ගොඩ අධ්‍යාපන කලාපයේ හික්කඩුව අධ්‍යාපන කොට්ඨාශයේ ගුරුවරුන් ඇසුරින්) | පී.ජී.ප්‍රේමදාස, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 04 | වයි.එස්.චාන්දනී ද සිල්වා | ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන්ගේ කියවීම් ප්‍රවර්ධනය සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳ ඇගයීමක් (කො/දකුණු කොළඹ අධ්‍යාපන කොට්ඨාශයේ ගුරුවරුන් ඇසුරින්) | පී.ජී.ප්‍රේමදාස, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 05 | අයි.එම්.ජී.රමනි කුමාරි | ගුරු පුස්තකාලයාධිපතිවරුන් සඳහා ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ව්‍යවහාර කරන අකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (2012 වර්ෂය තුළ කුරුණෑගල කලාපයේ පවත්වන පුහුණු වැඩසටහන්වලට සහභාගී වූ ගුරු පුස්තකාලයාධිපතිවරුන් ඇසුරින්) | ආර්.පී.පී.රණවීර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය |

## ජාතික පුස්තකාල හා විශ්‍රාපන විද්‍යායතනය
## 2014-12-31 දිනට ශේෂ පත්‍රය

| | සටහන් | 2014 | 2013 |
|---|---|---|---|
| | | රු | රු |
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් | 04 | 3,622,578 | 2,130,438 |
| ලැබිය යුතු ආදායම් | 05 | 1,818,189 | 1,456,821 |
| බඩු තොග | | 158,603 | 82,339 |
| පෙර ගෙවුම් | 06 | 63,711 | 61,054 |
| අනෙකුත් ජංගම වත්කම් | 07 | 3,696,194 | 3,369,526 |
| | | **9,359,275** | **7,100,178** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 3 | 86,000 | - |
| යන්ත්‍ර හා පිරියත | 3 | 6,026,174 | 5,884,841 |
| ඉඩම් හා ගොඩනැගිලි | 3 | - | 677,800 |
| | | **6,112,174** | **6,562,641** |
| **මුළු වත්කම්** | | **15,471,449** | **13,662,819** |
| | | | |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු වගකීම් | 08 | 529,357 | 456,176 |
| කෙටි කාලීන වෙන් කිරීම් | 09 | 4,082,475 | 2,934,547 |
| | | **4,611,832** | **3,390,723** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සේවක ප්‍රතිලාභ | 2 | 2,961,471 | 2,307,633 |
| | | **2,961,471** | **2,307,633** |
| **මුළු වගකීම්** | | **7,573,303** | **5,698,356** |
| **ශුද්ධ වත්කම්** | | **7,898,146** | **7,964,463** |
| | | | |
| **ශුද්ධ වත්කම්/කොටස්** | | | |
| **ප්‍රග්ධන දායකත්වය** | | | |
| අනෙකුත් රජයේ ආයතන | 10 | 35,393,223 | 33,545,451 |
| සමුච්චිත අතිරික්තය/ඌනතාවය | 11 | (27,495,077) | (25,580,989) |
| **මුළු ශුද්ධ වත්කම්** | | **7,898,146** | **7,964,463** |

**ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යායතනය**

**2014-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම**

| | සටහන් | 2014 | 2013 |
|---|---|---|---|
| | | රු | රු |
| **ආදායම්** | | | |
| බදු | | | |
| ගාස්තු දඩ හා බලපත්‍ර | 12 | 4,902,904 | 5,946,023 |
| පුනරුත්ථාපන හා නඩත්තු ප්‍රතිපාදන | | 179,082 | |
| රජයේ ප්‍රතිපාදන | 13 | 12,000,000 | 11,914,000 |
| වෙනත් ආදායම් | 14 | 1,308,697 | 1,588,785 |
| **මුළු ආදායම්** | | **18,390,683** | **19,448,808** |
| **වියදම්** | | | |
| වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ | 15 | 13,621,004 | 13,148,980 |
| සැපයුම් හා අනෙකුත් පරිභෝජන | 01 | 703,985 | 927,175 |
| ක්ෂය කිරීම් | 03 | 1,379,599 | 1,173,977 |
| අනෙකුත් වියදම් | 16 | 3,649,263 | 4,129,858 |
| මූල්‍ය පිරිවැය | 01 | 22,140 | 9,711 |
| KEID ව්‍යාපෘති වියදම් | | - | 275,000 |
| **මුළු වියදම්** | | **19,375,991** | **19,664,702** |
| **වර්ෂයේ ශුද්ධ අතිරික්තය/ඌනතාවය** | | **(985,308)** | **(215,893)** |

මගේ අංකය / எனது இல. / My No. : ඊසී/ජී/එන්අයිඑල්අයිඑස්/එෆ්ඒ/14    ඔබේ අංකය / உமது இல. / Your No. :    දිනය / திகதி / Date : 2016 ජනවාරි දින

අධ්‍යක්ෂ
ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2015 සැප්තැම්බර් 14 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34    +94-11-2887223    oaggov@sltnet.lk    www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන් ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

-----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03

---

(i) පෙර කාලපරිච්ඡේදවල වරදෙහි ස්වභාවය සහ රේඛීය අයිතමයන් සඳහා නිවැරදි කළයුතු මුදල හෙළිදරව් කළයුතු වූවත් සියළුම පෙර වර්ෂ ගැලපුම්, ලෙජර් ගිණුමක් ආශ්‍රයෙන් ගලපා එම ගිණුමේ වූ රු.928,781 ක හර ශේෂය සමුච්චිත ඌනතාවයට ගලපා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වෙනස් කිරීම් සම්බන්ධයෙන් එලෙස වෙනස් කිරීමට හේතුව සහ අතීතානුයෝගීව ගිණුම්කරණ ප්‍රතිපත්තිය ව්‍යවහාර කළා සේ සලකා අදාළ ගිණුම් ශේෂයන්හි ධාරණ අගයන්ට ගලපා සන්සන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07

---

(i) සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ එහෙත් නවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන පිරිවැය රු.26,058,970 ක් වූ ස්ථාවර වත්කම්වල සාධාරණ අගය පෙන්නුම් කිරීම සඳහා ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) දේපල පිරියත හා උපකරණ බැහැර කිරීමේදී ඇතිවන වාසි හෝ අවාසිය ගැලපිය යුතු නමුත් අබලි භාණ්ඩ ලෙස 2014 දෙසැම්බර් මාසයේදී ඉවත් කරන ලද ඒකක 102 කට අදාළ පිරිවැය හා සමුච්චිත ක්ෂය සඳහා ගැලපීම් සිදුකර නොතිබුණි.

2.2.2 නොසැසඳූ පාලන ගිණුම්

---

සමාලෝචිත වර්ෂය අවසන් දිනට ගිණුම් විෂයයන් 07 ක ශේෂ, උපලේඛන හා වාර්තාවල ශේෂ සමඟ සැසඳීමේදී එකතුව රු.3,436,611 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

ආයතන 06 ක් වෙත ගෙවා තිබූ එකතුව රු.104.408 ක් වූ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් වන වාර්තා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය ප්‍රකාරව විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.985,307 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව, ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.215,893 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.769,414 කින් පිරිහී තිබුණි. වියදම් රු.288,712 කින් අඩුවී තිබුණද ගාස්තු, දඩ හා බලපත්‍ර ආදායම් රු.1,043,119 කින් අඩුවීම මෙම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. වාර්ෂිකව ඌනතාවය ඉහලයාම හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ඌනතාවය රු.27,495,077 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1999 අංක 01 දරන ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතන නියමාවලියේ 4 (අ) සහ (ඇ) වගන්ති ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා නොගෙන 2003 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ පශ්චාත් උපාධි පාඨමාලා 36 ක්ද , ඩිප්ලෝමා පාඨමාලා 15 ක් ද, සහතික පත්‍ර පාඨමාලා 37 ක් ද වශයෙන් පාඨමාලා 88 ක් ආරම්භ කර සියුන් 1,533 දෙනෙකු ලියාපදිංචි කර තිබූ අතර ඉන් සිසුන් 789 දෙනෙකු සඳහා සහතිකපත් පිරිනමා තිබුණි.

(ආ) ආයතනය විසින් 2003 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ආරම්භ කර තිබූ පාඨමාලා 15 කින් පාඨමාලා 13 ක විෂය නිර්දේශ සංශෝධනය කර නොතිබුණි.

(ඇ) සිසුන් 07 දෙනෙකු පමණක් ලියාපදිංචි වී තිබූ 2007 වර්ෂයේ ආරම්භ කරන ලද දර්ශනපති / දර්ශනශූරි 2007/2010 තුන් අවුරුදු පාඨමාලාව වසර 08 ක් පමණ ගතවී ඇතත් අවසන් කිරීමට නොහැකි වී තිබූ අතර සිසුන් පස් දෙනෙකු පාඨමාලාව හැරගොස් තිබුණි. තවත් පාඨමාලා 05 ක් නිම කිරීමට සැලසුම් කළ දිනට වඩා මාස 03 සිට මාස 07 කට අධික කාලයක් ගත වී තිබුණද අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් අයදුම් නොකිරීම හේතුවෙන් පාඨමාලා 05 ක් ද ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් තවත් පාඨමාලා හා පුහුණු වැඩසටහන් 09 ක් ද පැවැත්වීමට නොහැකි වී තිබුණි.

(ඉ) කාර්තුමය වශයෙන් ප්‍රකාශයට පත්කිරීමට සැලසුම් කරන ලද සිංහල හා දෙමළ මුද්‍රිත ප්‍රවෘත්ති පත්‍රිකා සමාලෝචිත වර්ෂයේදී ප්‍රකාශයට පත්කිරීමට නොහැකි වී තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුදල් භාරගැනීම සඳහා ස්ථිර නිලධාරියෙකු පත් නොකිරීම, මුදල් පොත දෛනිකව තුලනය නොකිරීම, එහි ඇතුළත් සංඛ්‍යා අනුමැතියකින් තොරව වෙනස් කිරීම, අනුක්‍රමික අංක පිළිවෙලට ලදුපත් නිකුත් නොකිරීම හා එම අංක වෙනස් කර ඇති අවස්ථා තිබීම, දෛනික ලැබීම් හා ගෙවීම් ක්‍රමානුකූලව මුදල් පොතට ඇතුළත් නොකළ අවස්ථා තිබීම, චෙක්පොත් නිකුත් කිරීමේ ලේඛනයක් නොපැවැත්වීම, ලියන ලද චෙක්පත් නිතර නිතර අවලංගු කිරීම හා සමාලෝචිත වර්ෂයේදී රු.2,355,625 ක් වටිනා චෙක්පත් 81 ක් අවලංගු කර තිබීම, චෙක්පත් අංක හා වටිනාකම් මුදල් පොත හා ගෙවීම් වවුචර් අතර වෙනස්වන අවස්ථා තිබීම. අවලංගු කළ චෙක්පත් ලේඛනය අසම්පූර්ණ වීම වැනි කරුණු හේතුවෙන් මූල්‍ය පාලනය අසතුටුදායක තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

(ආ) ලෝක බැංකුවේ දෙවන සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය යටතේ ගුරු පුස්තකාලයාධිපතිවරු පුහුණු කිරීම සඳහා ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය ස්ථාපිත කර තිබූ අතර, 2009 අගෝස්තු 27 දිනැති අංක 09/1488/316/055 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් පුස්තකාල හා තොරතුරු විද්‍යා ගුරුවරුන් (ගුරු පුස්තකාලයාධිපතිවරුන්) විසින් ලබාගත යුතු වෘත්තීය සුදුසුකම්, ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි. එසේ වුවද, මේ වන තෙක් ගුරු සේවා ව්‍යවස්ථාවට අදාළ වෘත්තීය සුදුසුකම් ඇතුළත් කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) 1999 අංක 01 දරන ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතන නියමාවලියේ 7 (3) වගන්තිය ප්‍රකාරව ආයතනයේ සංවිධාන ව්‍යුහය තුළට උසස් උපාධි කමිටුවක් ඇතුළත් කර තිබුණ ද ආයතනය තුළ උසස් උපාධි කමිටුවක් පිහිටුවා නොතිබූ අතර දර්ශනපති / දර්ශනශූරි පාඨමාලා ව්‍යවස්ථාව අනුව උසස් උපාධි කමිටුවක් මඟින් සිදුවිය යුතු එම පාඨමාලාවට අදාළ කාර්යයන් ශාස්ත්‍රීය කමිටුව හරහා සිදුකර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ තොග පාරිභෝජන වියදම රු.406.023 ක් වුවද තොග නිකුත් කිරීම සම්බන්ධයෙන් විධිමත් පාලන ක්‍රම හඳුන්වා දී නොතිබුණි.

## 4.3 ආර්ථික නොවූ ගනුදෙනු

2003 වර්ෂයේදී ආයතනය ගොඩනැගීම සඳහා සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතියෙන් (GEP2) ලැබුණු රු.2,700,000 ක් අරමුණුගත කාර්යයෙහි නොයොදවා වර්ෂ ගණනාවක් තිස්සේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පෙර වර්ෂයේ ගිණුම්කරණ දෝෂ නිවැරදි කිරීම බාහිර පාර්ශවයකට පවරා තිබූ අතර එම දෝෂ සම්පූර්ණයෙන් නිවැරදි කර නොතිබියදී රු.30,000 ක දීමනාවක් ගෙවා තිබුණි.

(ආ) 1995 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාරය විසින් නිශ්චිතව අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් සිය සේවකයන්ට ගෙවිය යුතු වුවත් එලෙස අනුමැතිය ලබා නොගෙන පැවරුම් පදනම මත බඳවාගත් නිලධාරියෙකුට හා කාර්යමණ්ඩලයේ නිලධාරීන් 4 දෙනෙකු වෙත පාඨමාලා සම්බන්ධීකරණ ගාස්තු හා සහායක ගාස්තු ලෙස රු.131,533 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂය අවසාන දිනට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 04 ක් පුරප්පාඩු වී තිබුණි. ඉන් මාණ්ඩලික නොවන පුරප්පාඩු තනතුරු 03 ක් සඳහා 2007 සහ 2011 වර්ෂයන්හි සිට පැවරුම් පදනම මත බඳවාගත් නිලධාරීන් තිදෙනෙකුගේ සේවය ලබාගෙන තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් විය යුතු සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය, දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක් මුදල් අවශ්‍යතා සැලැස්ම, අයවැය ලේඛනය, ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 වගන්තිය අනුව අයවැය ලේඛනය සමඟ අයවැයගත ආදායම් ප්‍රකාශනය, ශේෂ පත්‍රය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අයවැයගත හා තථ්‍ය ආදායම්, වියදම් අතර සියයට 10 සිට සියයට 112 දක්වා පරාසයක විචලනයන් පැවතීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ලේඛන පවත්වාගෙන යාම
(ඇ) මූල්‍ය පාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) ගබඩා පාලනය
(ඊ) අයවැය පාලනය
(උ) අත්තිකාරම් පාලනය
(ඌ) ප්‍රසම්පාදන කටයුතු

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

NILIS

# National Institute of Library and Information Sciences

University of Colombo, P.O. Box 1698 Colombo 03, Sri Lanka

Tele /Fax: +94-11-2507150, e-mail: director@nilis.cmb.ac.lk, Web: www.nilis.cmb.ac.lk

මගේ අංකය NILIS/35/2/14

02.03.2016

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72
පොල්දූව පාර
බත්තරමුල්ල.

මහත්මයාණෙනි

**<u>කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.</u>**

අප වෙත ලැබී ඇති ඊසී/ජී/එන්අයිඑල්අයිඑස්/එෆ්ඒ/14 දරන විගණන වාර්තාවේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් අප ආයතනයේ අදහස් හා පැහැදිලි කිරීම් පහත පරිදි වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

2.2.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03.

(i),(ii) ඉදිරි වර්ෂ වල ගිණුම් පිළිවෙළ කිරිමේදී සුදුසු පරිදි කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07.

(i) ප්‍රත්‍යාගණනනය කළයුතු ස්ථාවර වත්කම් කාණ්ඩය හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(ii) අදාළ ගැලපීම් සිදුකර 2015 වර්ෂයේ අවසන් ගිණුම් වලට ඇතුලත් කර ඇත.

2.2.2. 2015 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේදී අවශ්‍ය ගැලපීම් සිදුකර ගිණුම් වලට ඇතුලත් කරන ලදි.

2.3. නීති රීති,රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම.
දැනට එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් අදාළ නීති ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

**3.මූල්‍ය සමාලෝචනය.**

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

නව පාඨමාලා හඳුන්වා දීම තුළින් පාඨමාලා ආදායම වැඩිකර ගැනීමටත් ආයතනයේ වියදම් හැකිතාක් දුරට අඩුකර ගැනීමටත් අවශ්‍ය පියවර ගෙන ඇත.

**4.මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය.**

:අ) මෙම සියළු පාඨමාලා සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ සනාථ සභාවේ සහ පාලක සභාවේ අනුමැතිය ලැබී ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය අයදුම් පත් ඉදිරිපත් කර ඇත.

:ආ) 2003 වර්ෂයේ ආරම්භ කළ MTL, PGTL පාඨමාලාවන්හි විෂයමාලා සංශෝධනය කර ඇත.2012 වර්ෂයේ විෂයමාලාසංශෝධනය කර සනාතන සභාවේ අනුමැතිය ලබා ඇති අතර 2014 වර්ෂයේ ද 2015 වර්ෂයේ කීප වාරයක් කමිටු රැස් වූ අතර ඒ පිළිබඳව කටයුතු කරගෙන යනු ලැබේ.

(ඇ) මෙම පාඨමාලා සඳහා මුලදී බැඳෙන ශිෂ්‍යයින්ගෙන් කොටසක් විවිධ හේතුන් නිසා පාඨමාලාව සම්පූර්ණ කර ගත නොහැකිව ඉවත් වී ඇත. දැනට අධ්‍යයන කටයුතු වල නිරත වන සිසුන්ගෙන් එක් සිසුවියක් තම උපාධි නිබන්ධය භාර දී ඇති අතර අනෙක් සිසුන් තම උපාධි නිබන්ධයේ වැඩකටයුතු දැනට කරගෙන යනු ඇත.MPhil/PhD 2011/2014 පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ සිසුන් තවමත් ඔවුන්ගේ උපාධි නිබන්ධන සම්පූර්ණ කර නොමැති නිසා පාඨමාලාව අවසන් කිරීමට නොහැකි වී ඇත.

MTL 2014/2015 සහ PGTL 2014/2015 පාඨමාලාවන්හි 2015 ජූලි මස වන විට සියලු සෙමෙස්තර විභාග පරීක්ෂණ පවත්වා නිම කර තිබූ අතර සිසුන්ට ඔවුන්ගේ උපාධි නිබන්ධය භාර දීමට නොහැකි වී තිබුණි.PLIM 2014/2015 සහ DLIM 2013/2014 පාඨමාලාවන්හි 2015 ජූලි මස වන විට සියලු සෙමෙස්තර විභාග පරීක්ෂණ පවත්වා නිම කර තිබූ අතර සිසුන්ට ඔවුන්ගේ ව්‍යාපෘති වාර්තාව භාර දීමට නොහැකි වී තිබුණි.

(ඈ) ක්‍රියාකාරි සැලැස්මට අනුව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පාඨමාලා පැවැත්වීමට නොහැකි වූයේ ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් නොමැති වූ බැවිනි.

(ඉ) 2014 වර්ෂයේ දී මුද්‍රිත ප්‍රවෘත්ති පත්‍රිකා එක් කාර්තුවක දී ප්‍රකාශයට පත් කර ඇත. කාර්ය මණ්ඩලයේ කාර්ය බහුලබව හේතුවෙන් අනෙක් කාර්තු ප්‍රකාශයට පත් කිරීමට නොහැකි විය.

**4.2.කළමණාකරණ අකාර්යක්ෂමතා**

(අ) දක්වා ඇති දුර්වලතාවයන් මඟ හරවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ආ) ගුරු පුස්තකාලයාධිපතිවරුන්ගේ උසස් වීම් නිර්ණායක ඇති කර ඔවුන්ගේ තනතුරු නාමයට පිළිගැනීමක් ඇතිවෙන තත්ත්වයක් ඇති කිරීම යන කරුණ නිරාකරණය කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙතෙක් නිසි පියවර නොගැනීම හේතුවෙන් අප ආයතනයේ පාඨමාලා සඳහා ලියාපදිංචි වීමට ගුරුවරුන් මැලිකමක් දක්වයි. මෙම කාරණය සම්බන්ධයෙන් දිගින් දිගටම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත කරුණු ඉදිරිපත් කර ඇත.මේ සම්බන්ධව පසුගිය පාර්ලිමේන්තු කාරක සභා රැස්වීමක දී සාකච්ඡාවට භාජනය කරන ලදී. එවකට සිටි COPE සභාපති පැවසුයේ මෙම ගැටලුව නිරාකරණය කිරීම අධ්‍යාපන අමාත්‍යාශය සහ උසස් අධ්‍යාපන අමාත්‍යාශය එක්ව කළ යුතු

බවයි.මේ සම්බන්ධයෙන් වර්තමාන අධ්‍යාපන ඇමතිතුමා සමග ද සාකච්ඡාවක් පවත්වන ලදී. 2015 දෙසැම්බර් මස සාකච්ඡාවක් පවත්වන ලදී.

(ඇ) නියමාවලියේ 7 (3) අනුව ආයතනයේ සියළුම අධ්‍යයන පර්යේෂණ හා විභාග සඳහා අනුමැතිය දීමට බලය පවරා ඇත්තේ ශාස්ත්‍රීය කමිටුව වෙතය. එබැවින් උසස් උපාධි කමිටුව රැස් නොවුන අවස්ථාවලදී ශාස්ත්‍රීය කමිටුවේ නිර්දේශ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට හා සනාතන සභාවේ අනුමැතිය සඳහා යවනු ලැබේ. 2015 වර්ෂයට උසස් උපාධි කමිටුව නම් කර ඇත.

(ඇ) පරීක්ෂා කර බලා නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබේ.

**4.3. ද්‍රවශීලීතා අර්බුදයකදී,මූල්‍යමය වශයෙන් ඇතිවිය හැකි අර්බුදකාරි තත්ත්වය මග හරවා ගැනීම පිණිස ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර ඇත.**

**4.4.මත භේදයට තුඩු දුන් ගනුදෙනු**

(අ) කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව පැවරුම් පදනම මත බාහිර පාර්ශවයකට මෙම කටයුත්ත භාරදුන් අතර කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව අදාළ ගෙවීම් සිදු කර ඇත.

(ආ) කළමණාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද පාඨමාලා අයවැයලේඛන වල වෙනස් කරන ලද උපයන ලද මුදල් වලින් මෙලෙස ගෙවීම් සිදු කර ඇත.

**4.5.කාර්ය මණ්ඩල පරිපාලනය**

මේ සම්බන්ධව අමාත්‍යතුමාගේ නිර්දේශයන් ලබාගෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කරෙගන යනු ලැබේ.

**5.ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1. ක්‍රියාකාරි සැලැස්ම.**

එම විස්තර ඇතුලත් කොට නැවත වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කරන ලදි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

(අ) අයවැය ගත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

(ආ) දක්වා ඇති අඩුපාඩු අවම වන ආකාරයට අයවැය ලේඛනය පිළියෙළ කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.

**6.0. දක්වා ඇති පද්ධති හා පාලන අඩුපාඩු අවම කර ගැනීමට පියවර ගනු ඇත.**